ලංවං
කැළුම් ශ්‍රීමාල් සමග ශානුක
හෙට හඳුන කයිය
බදාදා රාත්‍රී 10ට
Supreme Tv
Supreme TV
බලන්න
You Tube
Chatham Street TV
නිෂ්පාදනයක්




# The Chatham Street Journal

Trust your source. Trust your decisions. https://csj.lk/ 2023 | 06 | 11 Vol: 40





IMF ගොඩදාන වැඩේ හර්ෂට P 05

## මෝඩාභිමානය - I I

ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා ටෙලිකොම් වාර්තාව P 02

## වල්බුරු මාධ්‍ය නිදහස රටට සාපයක්




P 07

## මේ විපක්ෂය ජනතාවට බය වෙන යුගයකි



P 03

# I did it, I did it My way



# මෝඩාභිමානය II

# ජාතික ආරක්ෂාව සහ ටෙලිකොම්



ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු ආංශික කාරක සභාව විසින් පසුගිය සිකුරාදා (09) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පෞද්ගලිකකරණය කිරීමෙන් ජාතික ආරක්ෂාවට සිදුවන බලපෑම මැයෙන් වාර්තාවක් නිකුත් කර ඇත. එම වාර්තාවේ නිර්දේශය වී ඇත්තේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බැවින් ටෙලිකොම් ආයතනය පෞද්ගලිකකරණය කිරීමට නිර්දේශ නොකරන බවය.

මේ වාර්තාවේ අඩංගුව අනුව **"ටෙලිකොම් ආයතනය පෞද්ගලිකකරණය කිරීම ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන්නේය"** කියන්න එකතු කරගෙන ඇති තොරතුරු සහ **"එය ජාතික ආරක්ෂාවට තර්ජනයක්ය"** කියන්න ගොතන තර්කයන් සලකා බැලූ විට ඊට පශ්චාත් බාගයෙන් හිනාවීම හැර වෙන කියන්න දෙයක් නැත. අධෝ වාතයක් තරම්වත් ගණන් ගත යුතු දේ එහි අඩංගු නොවේ. නමුත් මෙය එහෙම බැහැර කළ නොහැක. මන්ද මේ වාර්තාවට පදනම වන ඊනියා ජාතිකවාදී චින්තනය තවදුරටත් රටට හානිකරමින් පවතින බව මෙයින් ප්‍රකාශ වන නිසාය. ජාතික ආරක්ෂාව... ජාතික ආරක්ෂාව... යනුවෙන් පසුගිය කාලයේ මර හඬ තලමින් නහයෙන් හඬමින් ගෙන ගිය ජාතිවාදී ආගම්වාදී ගෝත්‍රික දේශපාලන ව්‍යාපෘතියේම තවත් පච ප්‍රචාරකට වඩා දෙයක් මෙහි නැත. මේ කාරක සභාවේ සභාපතිවරයා වන්නේ හිටපු හමුදා නිලධාරියකු මෙන්ම ජාතිවාදී ප්‍රකාශනයේ පෙරමුණේ ගමරාළ කෙනෙකු වූ 'සරත් වීරසේකර'ය. එදා ඔවුන් ගෙන ගිය ජාතිවාදී දේශපාලන ව්‍යාපෘතිය තුළ කළ කී දේ මත පදනම්ව මෙම වාර්තාව ඔහු ඉදිරිපත් කර ඇත. මෙය මොහුගේ පෞද්ගලික මතය අනුව සිදු කළා යැයි සිතෙන තරමට වීරසේකරලාගේ ජාතිවාදී මතයන් හා මෙම වාර්තාව සමාන්තරව තිබේ. එහෙත් මේ ආංශික කාරක සභාවේ සෙසු සාමාජිකයන් පිළිබඳ සොයා බැලීමේදී එහි බහුතරයකුත් ජාතිවාදී ව්‍යාපෘතියෙම කොටස්කාරයන්ව සිටි අයය. ඒ නිසා මෙය මෙසේ වීම පුදුමයකුත් නොවේ.

විශේෂයෙන්ම මිලිටරි නිලධාරීන් දේශපාලනයට එන විට ඔවුන් කල්පනා කරන්නේම තුවක්කුවෙන්, බෝම්බයෙන්, යුද්ධයෙන් රට ජාතිය රකින විදිහ ගැනය. ඔවුන්ට අනුව ජාතික ආරක්ෂව යනු එයය. ජාතික ආරක්ෂාවට තර්ජනයක් වේ යැයි නිරන්තර බියකින් පසුවීම මෙසේ කල්පනා කිරීමට හේතුව විය හැකිය. මෙය මානසික ලෙඩක් කිව්වාට වැරදි නැත. අනෙක් කාරණය මේ අය ජාතික ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රධාන සටන් පාඨය කරගෙන පසුගිය යහපාලනය පෙරළා දමා ජාතික ආරක්ෂාවේ දෙවියන් වහන්සේ ලෙස හඳුන්වා බලයට ගෙන ආ ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ පාලනය විසින් ජාතික ආරක්ෂාවේ නාමයෙන් රටට කළ හරිය අමුතුවෙන් යළි පැහැදිලි කළ යුතු නැත. ජාතික ආරක්ෂාව, ජාතික සම්පත්, ජාතික දේපොළ ජාතික... ජාතික... කියමින් රට ලෝකයෙන් වෙන් කරමින් සිය රට දේ සිරි සැප දේ කියමින් කළ හරියේ වන්දිය තවම රට ගෙවමින් තිබේ. තවත් වසර හතඅටක්වත් යන තුරු හරි හැටි දෙපයින් නැගීටීමට බැරි තරමට රට බංකොලොත් කර විනාශ කර දැමුවේය. මෙයාලාගේ ජාතික ආරක්ෂාවෙන් රටට කළ හරිය එසේ තිබියදී යළි රට ගොඩනැගුමට ගන්නා දැවන්ත උත්සාහය කඩාකප්පල් කර ඊනියා ජාතික ආරක්ෂාවේ පාලනයක් බිහිකර ගැනීමට කරන දැඟලිල්ලක් ද මැතක සිට යළි පෙනෙන්නට තිබේ. රටට වින කරන මේ අවස්ථාවාදී ගෝත්‍රවාදී වර්ගවාදී මතවාදයන් පරාජය කර සුනු විසුනු කිරීමට අද නොහැකි වුවහොත් තව වැඩිකල් යන්නට පෙර යළිත් රට බේරාගන්නට එන ගෝත්‍රිකයන් ජාතික ආරක්ෂාවේ නාමයෙන් රටට කෙළවනු ඇත.

අද රටට අවශ්‍යව ඇත්තේ රට ලෝකයෙන් වහන් කරන ඊනියා ජාතික ආරක්ෂාව නොව ජාත්‍යන්තර ආරක්ෂාවය. ඊනියා ජාතික ආරක්ෂකයෝ විසින් කෙළවා දැමූ රට යළි මාස කිහිපයක් ඇතුලත යන්තම් ගොඩ දා ගත්තේ ජාත්‍යන්තරයේ ආරක්ෂාව රටට ලැබුණු බැවිනි. තවදුරටත් ඒ ජාත්‍යන්තර ආරක්ෂාව රටට අවශ්‍යව තිබේ. 2048 සංවර්ධන සිහිනය සැබෑ කරගත හැක්කේ ජාත්‍යන්තරයේ ආරක්ෂාව රටට ලැබීම මතය. මන්ද ජාතික... ජාතික... කියා රැක ගත් බම්බුවකින් කළ හැකි බිබික්කමක් රටේ නැති බැවිනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන අරමුදල, පැරිස් සමාජය, යුරෝපා සංගමය, මෙන්ම ආසියානු සංවිධානය, සාර්ක් සංවිධානය, ආදී කලාපීය රාජ්‍ය සංවිධාන, කලාපීය රාජ්‍යයන් ප්‍රමුඛව ලෝකයේ ප්‍රබල රාජ්‍යයන් විසින් ද අතහිත නොදුන්නා නම් අද මේ රටේ පුරවැසියන් ජාතික ආරක්ෂාවේ නාමයෙන් බාගෙට බාගයක් වැළලී ගොස් අවසන්ය.

තවත් කරුණක් වන්නේ මේ වන විටත් ශ්‍රී ලංකා ටෙලිකොම් යනු පෞද්ගලිකකරණය කළ ආයතනයක් වීමය. එය පෞද්ගලිකකරණය කිරීමට චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපති යුගයේදී ඇමති මංගල සමරවීර කටයුතු නොකරන්නට ශ්‍රී ලංකා ටෙලිකොම් යනුවෙන් දීප ව්‍යාප්ත දැවැන්ත ආයතනයක් රටේ නැත. පාඩු ලබමින් එලෝ මෙලෝ දියුණුවක් නැතිව තිබූ මේ ආයතනය වැසෙන්න ඉඩ නොදී එය පෞද්ගලික අංශයේ ආයෝජන සහිතව මේ තිබෙන තත්වයට දියුණු නොකර, එදා ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියා කල්පනා කර, ජාතික සම්පතක් කියා රැකගෙන සිටියා නම් අද සරත් වීරසේකරලාට කතා කරන්න වෙන්නේ එහෙන් මෙහෙන් ඇද ඇති පැටලුන දුරකතන වයර් ගොඩක් ගැන පමණි. ඒ වයර් කෑලි තඹ ඇලුමිනියම් හොරුන්ගෙන් ආරක්ෂා කරගන්නා හැටි ගැනය.

එසේම ටෙලිකොම් පෞද්ගලිකකරණය කිරීම ජාතික අරක්ෂාවට හානියක් වෙනවා නම් දැනටමත් රටේ ඇත්තේ ඒ ජාතික ආරක්ෂාවෙන් භාගයකි. මන්ද රජයට ඇත්තේ ටෙලිකොම්හි අයිතියෙන් භාගයක් නිසාය. මේවා තනිකර පිස්සු කතාය. විදුලි සංදේශ ක්ෂේත්‍රය නැතිනම් සයිබර් තොරතුරු තාක්ෂණික කලාපයන් රාජ්‍ය ආරක්ෂාවට දායකවන්නේ යම් ලෙසකින්ද ඊට හානියක් කර නොගෙන "ටෙලිකොම් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම" සිදු කිරීමේ හැකියාව තිබේ. ප්‍රතිව්‍යුහගත කිරීමෙන් සිදු කරන්නේ ගෙඩිය පිටින්ම කාට හෝ විකුණා දැමීමක් නොවේ. රාජ්‍යයේ ආරක්ෂාවට ඇවැසි කොටස රාජ්‍ය සතුව තබාගෙන ඊට අවශ්‍ය ආරක්ෂාව සහතික කරගැනීමකින් අනතුරුවය. සත්‍ය ලෙසම මේ ආංශික කාරක සභාව වෙතින් විය යුතුව තිබුණේ එම කාරණාව ගැන කතා කිරීමය.

ජාතික ආරක්ෂාවට, සයිබර් ආරක්ෂාව වැදගත් බව ඇත්තකි. නමුත් සයිබර් ආරක්ෂාව කියන්නේ ජාතික ආරක්ෂාව නොවේ. එය වෙන වැඩකි. සයිබර් ආරක්ෂාව වෙනුවෙන් ගත හැකි පිළියම් ඕනෑ තරම් තිබේ. නූතන තාක්ෂණය විසින් දේවල් නිපදවනවා සේම ඊට එරෙහිව වන දේත් නිපදවයි. ඒවායේ ආරක්ෂාව වෙනුවෙනුත් දේවල් නිපදවයි. ලෝකය එක තැනක තියෙන්නේ නැත. එය නිරන්තරයෙන් වෙනස් වෙමින් අලුත් අලුත් තත්වයන් නිර්මාණය කරයි. තාක්ෂණයත් හැම තප්පරයක් පාසාම අලුත් වෙමින් වර්ධනය වෙයි. ඒ නිසා මීට දශක ගණනාවකට පෙර තිබූ තත්වයන් සමග සයිබර් ආරක්ෂාව හෝ ජාතික ආරක්ෂාව ගැන හෝ කතා කිරීම හණමිටි කරගහගෙන යෑමකි. වීරසේකරගේ වාර්තාව අනුව තවමත් ඔවුන් සිටින්නේ ග්‍රීක යුගයේය. අනෙක ජාතික ආරක්ෂාව කියන සංකල්පයත් ජාතික රාජ්‍ය ඇතිවූ කාලය දක්වාම පරණය. අද තිබෙන්නේ ජාතික රාජ්‍යයන් නොවෙ ගෝලීය රාජ්‍යයන්ය. එනම් ගෝලීය වශයෙන් එකිනෙකට ගැට ගැසුණු බ්ලොක් චේන් එකක කොටස් ලෙසය. අද දැවන්ත රාජ්‍යයකට වුව ජාතික ආරක්ෂාව කියා රකින්න තිබෙන දේ සීමිතය. ශ්‍රී ලංකාව වැනි රටකට එහෙමමවත් කිසිවක් නැතැයි කීවත් එතරම් අවුලක් නැත. මන්ද ජාතික කිය කියා රකින්න යමක් ඉතිරිව ඇත්තේ ජාතිකවාදී ගෝත්‍රික මානසිකත්වය අනුව හදා ගත් බහුභූත මතවාදයන් ගොඩකි. මේවා සමඟ පසුගිය දශකවල ජීවත් වීම නිසා හදාගත් මානසිකත්වය අනුව මවාගෙන තිබෙන හිතලු ගොඩක් පමණය.

රට ලෝකය හා සමාන්තරව ගමනක් යෑම වෙනුවෙන් නව ගොඩනැංවීම් කරන විට ජාතිකවාදිනුත් එහිම නිවුන් සහෝදරයා කිව හැකි වාමාංශික ගෝත්‍රිකයනුත් ඉදිරියට ගන්නා සටන් පාඨය වී ඇත්තේ මේ ඊනියා ජාතික සම්පත් සහ ජාතික ආරක්ෂාවය. මේ දෙගොල්ල එකතුවෙලා රට ඔළුව උස්සන්න හදපු සෑම මොහොතකම මේ ජාතික පොල්ලෙන් ගසා ඔළුව කුඩු කර දැමීම සිදුකර රට හතර ගාතෙන් වට්ටවා ඇත. ජාතික ආරක්ෂාව නමින් ගෙන ආ පසුගිය පාලනය විසින් මරණාසන්න වෙන තුරු රටට වින කළේය. කොළඹ වාරයට විදේශ ආයෝජකයන් ගෙන එන විට එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියා කඩාකප්පල් කළේය. ත්‍රිකුණාමලයේ නිකම් මලකඩ කකා තිබෙන තෙල් ටැංකි සඳහා ආයෝජකයන් ගෙනෙන විට ජාතික ආරක්ෂාවට තර්ජනයක් කීවේය. ඇමරිකාව විසින් MCC ආධාර ලබාදෙන්න හදන විට එය රට දෙකඩ කරන ඇමරිකන් කුමන්ත්‍රණයක් විය. ඛනිජ තෙල් සංස්ථාවට විදේශ අයෝජනය ගෙනෙන විටත් ජාතික ආරක්ෂාවට තර්ජනයක් කීවේය. මෙවැනි තවත් උදාහරණ තිබේ. මේ ජාතික පිස්සුව විසින් රටට කෙළවා දැමීම හැර වෙන කළ දෙයක් නැත.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ ආංශික කාරක සභා ක්‍රමය ස්ථාපිත කිරීමෙන් බලාපොරොත්තු වූයේ නව අදහස් නව සංකල්ප සමඟින් රටේ අභිවෘද්ධිය පිණිස පාර්ලිමේන්තුවේ පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ අදහස් උකහා ගැනීමට මිස යළි රට ගෝත්‍රික යුගයකට දැක්කීමට නොවේ. ආංශික කාරක සභාවලින් විය යුත්තේ රජයේ ප්‍රතිපත්තිමය කාරණා වැඩපිළිවෙල වඩා යහපත් ලෙස රටට ජනතාවට වාසිදායක ලෙස යොදාගැනීම ගැන නිර්දේශයන් දීමටය. එහෙත් අතිශය පසුගාමී ජාතිවාදී ගෝත්‍රවාදී පසුගාමී අදහස්වලින් රාජ්‍යයේ අභිවෘද්ධියට අවශ්‍ය දෑ වන්නේ නැත. එමෙන්ම තමන් නොදන්නා ක්ෂෙත්‍රයක් ගැන සාකච්ඡා කළ යුතු නම්, ඒ ගැන නිර්දේශයක් දිය යුතු නම්, අදාල ක්ෂේත්‍රය ගැන යාවත්කාලීන නූතන දැනුම ඇති, එම ක්ෂේත්‍රයේ වෘත්තීමය වශයෙන් නියැලෙන, ජාත්‍යන්තර අත්දැකීම ඇති විශේෂඥයන් සමග වන සාකච්ඡා ආදියෙන් පසුව මෙවැනි වාර්තාවක් පිළිගත හැකි තාක්ෂණික කරුණු සහිතව ඉදිරිපත් කළ යුතුව තිබිණි. නමුත් මෙහි තිබෙන්නේ එහෙන් මෙහෙන් අහුලා ගන්නා ලද පරණ යල් පැන ගිය කතන්දර තොගයක් සහ පටු අවස්ථාවාදී වෘත්තීය සමිති විසින් සමාජගත කරමින් තිබෙන යාන්හැලි සමඟ තමන්ගේ පටු ජාතිවාදී දේශපාලනික වුවමනාවන් ප්‍රකාශයට පත් කිරීමක් පමණි.

ටෙලිකොම් පෞද්ගලිකකරණයට විරුද්ධ වන්නට නම් මෙවැනි හිතලුවලට වඩා සාධාරණ කරුණු ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම එමගින් වන අවාසියක් රටට වේ නම් ඒවා නිරාකරණය කරගැනීමට නිවැරදිම ක්‍රමවේදයන් යොදා ගත යුතුය. නමුත් මේ නන්දොඩවන ජාතිකවාදී කතන්දරවලට දිය හැකි එකම සාධාරණ උත්තරය වන්නේ මේවා කසල ගොඩකට දැමීම පමණි.

අද ලෝකය පිවිසෙමින් තිබෙන්නේ කෘත්‍රිම බුද්ධියේ යුගයටය. ලෝකයම එකම පද්ධතියකට එකතු වෙමින් තිබේ. මධ්‍යගත වීම හැරදා එය විසිරුවමින් විමධ්‍යගත වෙමින් තිබේ. ලෝකයේ පාලනය ද්විත්ව ධ්‍රැවීයකරණයෙන් ඉවත් වෙමින් නව බල කඳවුරු රැසකට වෙන් වෙමින් තිබේ. ඒ අතර සම්බන්ධතා පසමිතුරු වෙනවා වෙනුවට අන්‍යෝන්‍ය සහයෝගය මත යැපීම පදනම් කරගනිමින් තිබේ. කොටින්ම ලෝකය තනි යායක් වෙමින් තිබේ. අපට පියනගන්න තිබෙන්නේ ඒ ලෝකය සමග මිස මේ දූපත තාප්පයකින් වටකරගෙන ආරක්ෂා කරගත යුතු යුගයකට නොවේ. දූපත් මානසිකත්වයෙන් ගෝත්‍රික මානසිකත්වයෙන් රට විඳෙව්වා හොඳටම ඇතිය. මේ තාප්පය කඩා දමා අප ලෝකයට විවෘත විය යුතුය. ඊට යමෙක් එරෙහි වන්නේ නම් ඒ රටේ ද්‍රෝහියකු කියනවා මිස වෙන කියන්න දෙයක් නැත. තවත් ලෙසකින් කිව්වොත් යම් යම් ත්‍රස්තවාදීන්, ත්‍රස්ත සංවිධාන විසින් මේ රට විටින් විට කළ හානියට වඩා අති දැවැන්ත හානියක් මේ ඊනියා ජාතිකවාදීන් සහ ගෝත්‍රික වාමාංශිකයන් මෙ රටට සිදු කර තිබේ. ඒ අනුව නියම ත්‍රස්තවාදීන් වන්නේ ඔවුන්ය. සත්‍ය ලෙසම අද ජාතික ආරක්ෂාව නාමයෙන් යමක් සිදු කළ යුතු නම් මේ ත්‍රස්තයන්ගෙන් රට ආරක්ෂා කර ගැනීම වුව රටේ ආරක්ෂාවට ප්‍රමාණවත්ය.

ප්‍රභාත් ජයසුමන

# මේ විපක්ෂය ජනතාවට බය වෙන යුගයකි




රාජ්‍ය පාලනයේදි බලය හොබවන පාලකයන් කෙටි කාලීන දේශපාලනික වුවමණාවන් වෙනුවෙන් සිල්ලර ජනප්‍රිය තීන්දු තීරණ ගැනීම රට ක්‍රමයෙන් බංකොලොත්වීම දක්වා ගෙන ආ බව අද ඉතා පැහැදිලි යථාවාදී කථාවකි. එම තත්වයන් වෙනස් කර නව ප්‍රතිපත්ති සැලසුම් මත, රටේ දේශපාලනය ආර්ථිකය සහ සමාජීය කරණා ගැන තීන්දු තීරණ ගැනීමට වත්මන් ජනාධිපතිවරයා ඇතුලු ආණ්ඩු පක්ෂය තීන්දු කර තිබේ. මෙය සුපුරුදු ජනප්‍රිය දේශපාලනයට ඉඳුරාම වෙනස් ප්‍රතිපත්තියක් වන නමුදු රට වැටී තිබෙන තත්වයන් හමුවේ ඒ යළි ගොඩ නැගීම වෙනුවෙන් වෙනත් විකල්ප නොමැති බවත් යථාර්තය වී තිබේ. ඒ කෙසේ නමුදු රජය ගන්නා තීන්දු තීරණ ගැන නිරන්තරයෙන් විරුද්ධ මතයක් කරපින්නා ගැනීම විරුද්ධ පක්ෂවල දේශපාලනය බවට පත්ව තිබීමත් දීර්ග කාලීනව පවත්වාගෙන ආ වැරදි පිළිවෙතක් බවත් කිව යුතුය. ඊටත් වඩා පාලකයා විවේචනය කිරීමේදී සිල්ලර ජනප්‍රිය කරුණු කරණා පෙරටු කරගෙන එය සිදු කිරීම, ආණ්ඩුවක් ගන්නා ජනප්‍රිය තීන්දු තීරණයන්ට වඩා භයානක බව මේ රටේ ඉතිහාසයෙන්ම පෙන්වා දිය හැකිය. විපක්ෂය, ආණ්ඩුවට එරෙහිවීම කෙසේ හෝ කළ යුතුවීම තමන්ගේ පැවැත්මට අවශ්‍ය බව සිතන නිසා ජනප්‍රිය සටන්පාඨ යොදා ගැනීම සිදු කළත් ඔවුන් බලයට පැමිණි පසුවත් එම සටන් පාඨ අනුව රාජ්‍ය පාලනයේ තීන්දු ගැනීමට යෑමේ ආදීනව හොඳටම දකින්න ලැබුණේ පසුගිය ගෝඨා පාලනය සමගය. ඒ අවසන් වූයේ ඉතා කෙටි කලකින් රට බංකොලොත් වීමෙනි.

යහපාලන ආණ්ඩුව පෙරළා දැමීම සඳහා එදා සටන් පාඨ කරගත් බදු විරෝධය මත බලයට ආ සැනින් බදු ලිහිල් කරන ලදී. රාජ්‍ය ආදායම අහිමි වී රට එදිනෙදා අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන් හෝ ලබාදීමට නොහැකි තැනට පත් විය. ඒ වගේම යහපාලන ආණ්ඩු සමයේදි සිදු කිරීමට නියමිත වූ විදේශ ආයෝජන සහිත ව්‍යාපෘති ගණනාවකටම එරෙහි වූයේ රට විකුණන බවට චෝදනා කරමිනි. මේ අය එම ආයෝජන අහෝසි කරන ලදී. රටට ලැබෙන්න තිබූ විදේශ විනිමය සහ සංවර්ධනයේ නව මංපෙත් ගනනාවක් එමගින් අහිමි කරගත් අතර රාජ්‍ය ගණනාවක් සමග තිබූ මිතුරු සබඳතා පළුදු විය. විශේෂයෙන්ම ජපන් ආයෝජන රැසක් මෙහිදී අහිමි වූ අතර මෑත ඉතිහාසය පුරා මෙරට සමීප මිතුරකු ලෙස මෙරට වැඩිම ආධාර ප්‍රමාණයක් ලබා දී ඇති ජපානය විරසක කරගත්තේය. තවමත් ජපානයේ හොඳ හිත දිනාගැනීමට වත්මන් පාලනයට වෙහෙසකර ව්‍යායාමයක යෙදෙන්නට සිදුව ඇත. රසායනික පොහොර තහනමත් මෙවැනිම වැරදි තීන්දුවකි. රසායනික පොහොර මගින් වකුගඩු රෝගය පැතිරෙනවාය කියන මිත්‍යාව වපුරා පැවැති ආණ්ඩුව ඒ වැලැක්වීමට පියවර ගන්නේ නැතැයි කියමින් කළ චෝදනාව අවසන් වූයේ රසායනික පොහොර තහනම් කරමිනි. එහි ආදීනව තවමත් අවසන් නැත. ගෝඨා පාලනය පැමිණ විගස කළ තවත් මරිමෝඩ කටයුත්තක් වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත් වීමට දැක්වූ විරෝධය මත ඒ සමග තිබූ ගිවිසුමෙන් ඉවත් වීමය. යහපාලනයට පෙර පැවැති මහින්ද රාජපක්ෂ පාලනය විසින් කාබාසීනියා කර තිබූ ආර්ථිකය යළි නිවැරදි මාවතට ගනු ලැබුවේ මූල්‍ය අරමුදල සමග වූ ණය ගිවිසුමක් හරහා සිදු කෙරුනු ආර්ථික ප්‍රතිසංකරණයන්ට පින් සිදු වන්නටය. ගෝඨා පාලනය එම නිර්දේශ බල්ලට දමා තමන්ගේ දැනුමේ අවබෝධයේ තරමට සියරට දේ සිරිසැප දේ කියමින් රටේ ආර්ථිකය මෙහෙයවන්නට ගැනීම ආර්ථික අර්බුදයට හේතු වූ පළමු පියවරය.

කෙසේ නමුත් ඉතිහාසයෙන් පාඩම් ඉගෙන නොගන්නා වත්මන් විපක්ෂයත් තවමත් සිදුකරමින් සිටින්නේ සුපුරුදු සිල්ලර දේශපාලනයම ය. වත්මන් පාලනය සම්බන්ධයෙන් සමගි ජන බලවේගයට සම්බන්ධ විශ්වවිද්‍යාල ආචාර්යවරයකුගේ තබා තිබූ ෆේස්බුක් සටහනකින් මේ විපක්ෂයේ මතය දක්වා තිබිණි. ඒ මෙසේය.

**"වික්‍රමසිංහ යටතේ ආර්ථික ගැටලුව විසඳෙයිද බවට වන කතිකාවක් දියත් කෙරෙමින් පවතී. පෝළිම් අවසන් වීම, ඩොලරය පහළයාම,... වැනි මතුපිටට පෙනෙන කරුණු පදනම් කරගෙන වික්‍රමසිංහ පාලනය ගෝඨාභයට වඩා සාර්ථක එකක් ලෙස හුවා දැක්වීම එහි එක අරමුණකි. අනෙක ඊළග ජනාධිපතිවරණය අරබයා ගෙනයන ප්‍රචාරණ ව්‍යාපෘතියයි. දිළිඳු සහ මධ්‍යම පංතික ජනතාව මත දැවැන්ත බදු බරක් පටවමින් ගෙනයන පාලනය ගෝඨාභය පාලනය හෝ වෙනත් ඉන් පෙර පැවති එකක් සමග සැසඳීමට යාමම එක පැත්තකින් අපහසු දෙයකි. ආර්ථික බංකොලොත්භාවය යනුම වික්‍රමසිංහ පාලනය ගොඩනගන එහි ප්‍රබලතම දෘෂ්ටිවාදීමය පදනමයි. මේ බංකොලොත් භාවයට එකම සරණ වික්‍රමසිංහ පාලනය යි යනුවෙන් වන මතයක් ජනගතවනවා දැකීම හැර වෙන සතුටක් එම පාලනයට තවත් පැවැතිය නොහැක.**

**නමුත් යථාර්ථය තුළ අපි ලොව දිළිඳුම රටවල් 10 අතරට පැමිණ සිටිමු. බිලියන 54ක ණය බරක් ඇත. ණය ප්‍රතිව්‍යුහකරණය හරහා ආර්ථික ස්ථාවර භාවයක් ඇතිවෙයිද යන ගැටලුවට පිළිතුරක් නැත. දේශීය සම්පත් විකිණීමට තබා ඇත. විදේශීය ණය කල් දැමීමට නම් චීනය, ඉන්දියාව සහ ජපානය ආදි රටවල් සියල්ලම එකම තැනකට ආයුතුය. එය තවම පැහැදිලි නැත. වික්‍රමසිංහ පාලනය විසින් මෙම රාජ්‍යය කලාපීය බල ගැටුම වෙත ඇද නොදමාවිය යන සහතිකය පවා අපට නැත... මෙවැනි දැවැන්ත අර්බුදයක් හමුවේ පවතින රටක සදාචාර විරෝධී දේශපාලන බල ව්‍යාපෘතියක නිරත සේම, ජාත්‍යන්තර නව ලිබරල් දැක්මකට සහ බල ව්‍යාපෘතියකට අනුව මෙහෙයවෙන පාලනයක් විසින් ඇතිකල හැකි වෙනස පිළිබද සාමාන්‍ය ජනතාවට පවතින අදහස කුමක්ද? පෙට්‍රල් තියෙනව නම්, බඩු මිල පහළ යනවා නම්... ආදී ලෙස සාමාන්‍ය ජනතාව දකින සහනය යනු රනිල්ගේ දෘෂ්ටිවාදීමය පාලනයේ ප්‍රචාරණ අංගයි.**

**කළණ ගුණසේකර හා බොහොමයක් සාමාන්‍ය ජනතාව වන අපට පෙනෙන දැනෙන දේ එපමණයි. නමුත් මතුපිට දේ සත්‍යය නම් විද්‍යාත්මක විග්‍රහයක් අවශ්‍යය නොවනු ඇත..."**

මේ සටහන බැලු බැල්මට විදග්ධ විග්‍රහයකි. වියතකුගේ බර වචන සහ ලිවීමේ රිද්මය ඒ බව පෙන්වා දෙයි. එහෙත් මෙහි අන්තර්ගතය මොන තරම් ගොබ්බද, පාර්ශ්විකද සහ වැරදි සහගත බවද ඒ පිළිබද සරළ විමසුමකින් පවා අවබෝධකර ගත හැකිය. විපක්ෂයේ සිල්ලර දේශපාලනය කියන්නේ මෙයටය. එය විදග්ධ ආකාරයෙන් කෙරෙන්නෙ මෙසේය. ඒ කාලයේ 'වියත්මග' සිදු කළෙත් මෙයය. වර්තමානයේ සමගි ජන බලවේගයට, ජාතික ජන බලවේගයට, පෙරටුගාමී වැනි රැඩිකල් කියන කණ්ඩායම්වලට සම්බන්ධව සිටින වියතුන්ය කියන පිරිස කරන්නෙත් 'වියත්මග' සේම ජනතාව විදග්ධ ලෙස රවටා නොමග යැවීමය. දැන් මෙම සටහන ගැන බැලුවහොත් කිසි වගවිභාගයක් නොමැතිව පවසන්නේ වත්මන් පාලනය විසින් පොලිම් අවසන් කිරීම, ඩොලරයේ අගය පහලට දැමීම වැනි දේ මවාපෑම කරන්නේ මීළඟ ජනාධිපතිවරණයට අදාලව රනිල්ගේ ප්‍රචාරක ව්‍යපෘතියක් ලෙසය. ඒ අනුව මේවා සිදු නොකර තිබිය යුතු දේය. පෝලිම් අවසන් නොකළ යුතුය, ඩොලරය ඉහල අඩියක තබා ගත යුතුය. පොලී අනුපාතයන් උද්ධමනය ඉහළ යා යුතුය. එසේ කළා නම් විපක්ෂයට අනුව රනිල් වැඩ්ඩෙක් වෙනවාද? මේවා මරු තර්කය. ඉන් පසුව කියන්නේ ආර්ථික බංකොලොත්භාවය පවත්වාගෙන යෑම රනිල් පාලනයේ දෘෂ්ඨිවාදය නැතිනම් සමාජය මෙහෙයවන මතවාදී උපක්‍රමය බවය. එනම් රට ගොඩදැමීමට හැක්කේ රනිල්ට පමණක් කියන මතය නිර්මාණය කිරීමට, රට බංකොලොත් භාවයේම තබා ගැනීමට රනිල් කටයුතු කරන බවය. දැන් ඉහතින් කී අදහසත් මෙම අදහසත් පරස්පර බව මේ වියතාට නොතේරුනත් දෙකේ පංතියේ ළමයකුට වුව තේරුම් ගත හැකිය. අනෙක් අවුල රට බංකොලොත්භාවයෙන් ගොඩගෙන රනිල් තවත් ඉදිරි පියවරකට ගමන් කරමින් තිබෙන මොහොතක මේ දෙඩවිල්ල කිරීමය.

මීළඟට ලොව දිළිඳුම රාජ්‍ය 10 අතරට ශ්‍රී ලංකාව පැමිණ ඇතැයි කියන පට්ටපල් බොරුව කියයි. මේවා කොයි ලෝකයෙන් සොයාගන්නා තොරතුරුද යන්න අපට ද වැටහීමක් නැත. රටේ ණය බර ඩොලර් බිලියන 50 ඉක්මවා ඇති බව ඇත්තකි. ඒ 75 වසරක් මුළුල්ලේ ගත් ණයවලින් තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණයයි. එම කාලය තුළ රට ලබාගෙන තිබෙන සමස්ථ ණය ප්‍රමාණය මීට වඩා කිහිප ගුණයකින් විශාලය. නමුත් එයින් වැඩිම ප්‍රමාණයක් පොලී සමඟ ගෙවා අවසන් කර ඇත. ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් කරන්නේ මේ ඉතිරි ණය ගෙවීම සඳහා සහනයක් නැතිනම් කාලයක් ඉල්ලා සිටීමටය. එය තාවකාලිකව අර්බුදයෙන් ගොඩ ඒමට ගන්නා පියවරකි. කොහොමටත් මෙම බිලියන 50ක ණය කියන්නෙ අද හෙට ගෙවන්න තිබෙන ඒවාද නොවෙයි. දීර්ග කාලීනව ගෙවීමේ පදනම යටතේ ලබා ගත් ණයය. ගැටළුවකට ඇත්තේ ඉදිරි වසර දෙක තුන තුළ ගෙවන්නට ඇති බිලියන 10ක පමණ ණය සම්බන්ධයෙනි. සහනයක් ඉල්ලන්නේ ඒ ණය සඳහාය. ඒ සඳහා මෙතෙක් කළ සාකච්ඡා සාර්ථකය. ඒ අනිවාර්යෙන්ම සාර්ථක වනු ඇත. මන්ද කිසිසේත්ම ජාත්‍යන්තරය මේ රට කඩා වැටීමට ඉඩ නොතබන බව නිසැක නිසාය. රට කඩා වැටුණොත් එහි පාඩුව වන්නේ ණය හිමියන්ටමය. දැන් සාකච්ඡා කරන්නේ ණය ගෙවීම ක්‍රමවේදය ගැන මිසක් ණය නොගෙවා සිටීම ගැන නොවේ. විපක්ෂ වියතුන්ට ඒ ගැන මෙලෝ අලබෝලයක දැනීමක් නැති බව මේ සටහනෙන්ද පැහැදිලිය.

ඒ අතර, වික්‍රමසිංහ පාලනය මෙම කලාපය තුළ රාජ්‍යන් අතර ගැටුමකට ඇද දමාවීය කියන සැකය මතු කරයි. නමුත් ජනාධිපතිවරයා දැඩි උත්සහයක නිරතව සිටින්නේ එවැනි ගැටුම ඇති නොවීම පිණිස වන ජාත්‍යන්තර මෙහෙයුමකට නායකත්වය දෙමින් බව පසුගිය සති කිහිපය තුළ ඔහු ජාත්‍යන්තරය අමතා දැක්වූ කරුණු දැක්වීම්වලින් පැහැදිලිය. අමෙරිකාවේ හෝ චීනයේ යටහත්භාවයට පත්නොවී ස්වාධීන ස්වෛරී රාජ්‍යක් ලෙස ආසියානු කලාපය තුළ ඇති සියළුම රාජ්‍යයන්ට නැගීසිටීම වෙනුවෙන් ඇති අයිතිය ගැන රනිල් දිගින් දිගටම පෙන්වා දී ඇත. නමුත් පෙර පැවති පාලනයන් තුල අමෙරිකාවට, බටහිර රටවලට, සොවියට් රුසියාවට, ඉන්දියාවට හෝ චීනයට හෝ සමීප වීම, යටහත්වීම නිසා රට ජාත්‍යන්ර උගුල්වල පැටලිනි. ඒ නිසාම රටේ ආර්ථිකයට හානි කරගත් බවත් රහසක් නොවේ. එහෙත් අද විපක්ෂ කොටස් නැවත උත්සහ ගන්නෙත් මේ බලගතු රාජ්‍යයකට රට උකස්කර හෝ තමන්ගේ ගොඩ යෑම සහතික කරගැනීමේ තක්කඩි උපායන් වෙතට පිවිසීමටය. රනිල්ගේ මැදුම් පිළිවෙත ඉවසන්න නොහැකිව සිටින්නේ ඒ නිසාය.

මේ අයට රනිල් පාලනය විසින් ජනතාවට ලබා දී ඇති සහනය ගැන ජනතාවට තිබෙන මතය කුමක්දැයි වටහා ගත නොහැකි බවත් පැහැදිලිය. ගාලු මුවදොර අරගලයට සක්‍රියව මැදිහත් වූ රංගන ශිල්පියකු වන කළණ ගුණසේකර පසුගියදා රනිල් මේ මොහොතේ කරමින් සිටින කාර්යභාරය අගයා තිබිණි. ආචාර්යවරයාට තිබෙන ගැටළුව මේ රංගන ශිල්පියා මෙන් සාමාන්‍ය ජනතාවද කල්පනා කරනවා නම් තමන්ට සොරි ඩොට් කොම් වීම අනිවාර්යයක් වීම ගැනය. ඒක ඇත්තය.

පොලිම් නැති කිරීම, භාණ්ඩ හිඟය නැති කිරීම, ඩොලරයේ අගය පහළයෑම, පොලී අනුපාතයන් උද්ධමනය අවම කිරීම, ආනයන සීමා ඉවත් වීම, රටේ නීතිය හා සාමය ස්ථාපිත කිරීම ආදිය මගින් ජනතාවට සහනයක් ලබා දීම, විපක්ෂයට අනුව ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපෘති වන්නේ ජනතාව අපේක්ෂා කළ දේ එමගින් සිදුව ඇති නිසාය. ඒ අනුව එයට ජනතාවගේ සහය,කැමැත්ත බුරුතු පිටින් ලැබෙන කොට විපක්ෂය බිය වීම සාධාරණය. සහන දීම වැරදියි කියන්න සිදුව ඇත්තේ ඒ නිසාය. මෙහිදී අනෙක් විශේෂත්වය නම් ජනප්‍රිය සිල්ලර තීන්දු නොගෙන යම්තරමකින් හෝ යළි ජනතාවම පිඩාවට පත්වන ජනප්‍රිය නොවන දුෂ්කර තීන්දු තීරණත් ජනතාව අනුමතකර තිබීමය. විපක්ෂයට එම තත්වය දරාගැනීමට හෝ මේ සිදුවන්නේ කුමක්ද කියා තේරුම් ගැනීමට හෝ නොහැකිව තිබේ. විපක්ෂ වියතුන් අන්දකයිප්පු වී මේ සිදුවන දේ විග්‍රහ කරගැනීමට නොහැකිව නැවත නැවත විකාරම දොඩවන තැනට පත්ව ඇති බව ඉහත වියතාගේම සටහනෙන් පැහැදිලිය.

ජනතාවට අවශ්‍යවන්නේ තමන්ගේ සුපුරුදු ජීවන චර්යාව බාධාවකින් අපහසුවකින් තොරව පවත්වාගෙන යෑමට හැකි පරිසරයක් තිබීමය. තමන්ගේ සහ තම දුවාදරුවන්ගේ අනාගත අපේක්ෂාවන් ඉටුවන විශ්වාසය සහ ඊට අවශ්‍ය පහසුව තිබීමය. එය රනිල් විසින් සිදුකර ඇත්නම් හෙට දවසේදීත් ජනතාවගේ පාලකයා වන්නෙ රනිල් මිස අන්දකයිප්පු විපක්ෂයේ විසුළුකාරී මුග්ධ අවස්ථාවාදී නායකයන් නොවේ. එහෙත් රනිල් ජනතාවගේ අත්‍යාවශ්‍ය වුවමණාවන් කෙටිකාලීනව විසඳීම රටේ ආර්ථිකය ස්ථාවර බවට පත්වීමක් වන්නේ නැත. ඊට ගත යුතු තවත් ක්‍රියාමාර්ග රැසක් තිබේ. ඊට අදාල ප්‍රතිසංස්කරණයන් රැසක් මේ වන විට ක්‍රියාත්මකව තිබෙන අතර තවදුරටත් විප්ලවීය පරිවර්තනයක් කරා වන වැඩ පිළිවෙල ද ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිතය. වැදගත්ම දේ මේ කවර ක්‍රියාමාර්ගයක් ගත්තත් එය ජනතාවට අමතර පීඩාවක් බාධාවක් වන්නට ඉඩ නොදී මල නොතලා රොන් ගන්නා සේ සුමටව පරිස්සමට ජනතා සහය ඇතිව සිදු කිරීමය. අද රනිල් ඒ සාර්ථකව සිදු කරමින් පවතී. නිවැරදි දේ වනවානම් ජනතාවට ඒ ගැන ප්‍රශ්න කිරීමට වුවමණාවක් නැත. රට කනපිට පෙරළා හෝ ජන අභිලාශයන් මුදුන් පත් වේ නම් එතැනින් එහා දෙයක් රාජ්‍ය පාලකයාගෙන් ජනතාවට අවශ්‍ය නැත. දැන් ජනතාව වෙතින් මතුවන අදහස එයය. කළණ ගුණසේකර කියන්නේ ඒ ගැනය. විපක්ෂය බය වී සිටින්නේ එයටය.

සෝෂක

# I did it, My way

යහපාලන ආණ්ඩුව පැවැති කාලයේ, පළ වී තිබූ පුවත්පත් දැන්වීමක් දැක, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා **"මොකටද මගේ මූණ මේකට, ජනපතිට ඕනෙ නම් එයාගෙ එක දාගන්න. මගේ මූණ දාන්න එපා. අනික කොහොමත් ඔය දැන්වීම්වලට වියදම් කරන්න එපා. වැඩේට වියදම් කරන්න, Let the work to talk"** යනුවෙන් පැවසීය. ඒ රනිල්ගේ හැටිය, ඔහු හිතන හැටි ය, ඔහු කරන දේ කුමක් දැයි පුරාජේරු නොගසයි, ඒ නිසාම එය බොහෝ දෙනෙකුට නොතේරෙයි. ඔහු සහ සමාජය අතර ඇති මේ පරතරය නිසා ඔහු කරන බොහෝ දේ විවේචනයට ලක්වේ.

රනිල්, අධ්‍යාපන ඇමතිවරයා ලෙස ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ ධවල පත්‍රිකාවේ දිගුකාලීන අරමුණු හඳුනා නොගෙන එයට එරෙහිව බිල්ලෙක් මවා රනිල් නිදහස් අධ්‍යාපනයේ ද්‍රෝහියා ලෙස හංවඩු ගසන ලදී. එහෙත් අද ආපසු හැරී බලන විට, ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික විද්‍යා පීඨ, බෙල්වුඩ්, ජාතික පාසල් ක්‍රීඩා උළෙල ආදී බොහෝ දෑ ඔහු නිර්මාණය කළ දෑය. එසේම ඔහු යෝජනා කළ, එහෙත් සිදු කිරීමට ඉඩ නොදුන් ප්‍රතිසංස්කරණ පසු කාලීනව එකිනෙක ක්‍රියාවට නංවන්නට විය.

රනිල්, කර්මාන්ත ඇමතිවරයා ලෙස ආයෝජන කලාප නිර්මාණය කරන විට, ඒවා **"සුද්දන්ට ජංගි මහන තැන්"** ලෙස අපහාසයට ලක් විය. නාසි වධකාගාර මෙන් ශ්‍රමය සූරා කන කලාප ලෙස බිල්ලන් මවන ලදී.

එහෙත් අද රටේ අපනයන ආදායමේ ප්‍රධානම පංගුව එම ආයෝජන කලාපවල නිපදවන නිමි ඇඳුම් ය.

රනිල්, එල්.ටී.ටී.ඊ.ය සමඟ සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන ලදී. එවිට ඔහු රට පාවාදුන් නිවටයෙකු ලෙස හංවඩු ගසා දොන් ජුවන් ධර්මපාල ලෙසින්ද නම් කරන ලදී.

එහෙත් ටික කලකට පසු එල්.ටී.ටී.ඊ.යේ න්‍යායාචාර්යවරයා වන ඇන්ටන් බාලසිංහම් රනිල් කපටි නරියකු බවත්, ඔහු සටන් විරාම ගිවිසුමෙන් එල්.ටී.ටී.ඊ.ය දුර්වල කර භේදභින්න කර දැමූ බවත් අනෙක් අතට ඒ කාලය තුළ හමුදාව ශක්තිමත් කළ බවත් පැවසීය.


2002 වසරේදී ඔහු "Region in Sri Lanka" වැඩපිළිවෙළ ඉදිරිපත් කළ විට එය රට විකුණන මහා පාවාදීමේ වැඩසටහනක් ලෙස නම් කරන ලදී. එය බටහිර බිල්ලන් විසින් ලංකාව යළි අත්පත් කර ගැනීමට සැකසූ වැඩසටහනක් ලෙස අර්ථකථනය කරන ලදී.

ඉන් වසර 25 කට පසුව රට බංකොලොත් වී, විනාශයේ පතුලටම ගිලී ගිය විට, අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එක්ව ක්‍රියාවට නංවන්නේ, එදා පිළිකෙව් කළ වැඩපිළිවෙළේ ම දිගුවකි. විනාශයේ පතුලටම ගිලී තිබූ රට යළි හුස්ම ගන්න පටන් ගෙන ඇත්තේ එම වැඩපිළිවෙළ නිසා ය. 2048දී සංවර්ධිත රටක් බවට පත් කළ හැක්කේ ඒ මගේ ගමන් කිරීමෙනි.

මේ සියලු පැරණි අත්දැකීම්වලදී මෙන්ම මෙවරද රනිල් රට භාර ගත් විට ඔහු රාජපක්ෂලාගේ කොන්ත්‍රාත්තුවක් සිදු කිරීමට පැමිණි අයෙකු ලෙස හංවඩු ගසන ලදී. ඔහු රනිල් රාජපක්ෂ ලෙස නාමකරණය කරන ලදී. එහෙත් කලින් අවස්ථාවලදී මෙන් නොව මෙවර රට කඩා වැටුණු වේගයත්, රට සාමාන්‍යකරණය කිරීමට ඔහු ගත් කාලයත් නිසා බොහෝ දෙනෙකු ඔහු දෙස විමසිලිමත්ව සහ බලාපොරොත්තු සහගතව බලන ආකාරයක් පෙනේ.

ගාලුමුවදොර අරගලයේ, පෙරළිකාර කලාකරුවෙකු වූ කලණ ගුණසේකර **" මම රනිල්ට සැලියුට් කරනවා"** යැයි පවසන්නේ එබැවිනි.

**"රනිල්ට කට්ටිය සෑහෙන්න පහර එල්ල කළා, දරුවො ගැන කියලා, ඒවායින් ගැහුවා, පෞරුෂත්වය පැත්තෙන් ගැහුවා, මම කියන්නෙ විරුද්ධ පාක්ෂිකයන්ගෙන් මෙච්චර බැටකාපු ජනාධිපති කෙනෙක්**




**මම දැකලා නෑ. ලෝක ඉතිහාසය ඇතුලේ සාමාන්‍ය දන්න ඉතිහාසයේ දැකලා නෑ. මම රනිල් වික්‍රමසිංහට ගරු කරනවා නම් ගරු කරන එක හේතුවක් තමයි, පාලනය පැත්තෙන් මේ Control කරපු එකට මම එයාට Salute එකක් ගහන්න ඕනා. මොකද මේ වෙලාවේ අපිට හරිම විකල්පය කියලා දෙයක් නෑ. ඒත් එක්කම මම තව Salute එකක් ගහනවා මෙච්චර ඉවසන්න පුළුවන් මනෝභාවයක් තියෙන එකට"**

රැල්ලට මාලිමා වේදිකාවට බොහෝ කලාකරුවන් එක්රැස් විය. රැල්ල බැස යන විට ඔවුන් බොහෝ දෙනෙකුට, රැල්ලට රෙදි උස්සා ගත්තා වැඩි දැයි සිතෙන්නට පටන් ගෙන ඇතත්, එය බොහෝ දෙනෙක් මෙයට පෙර ගෝඨාභයගේ වේදිකාවේ ද, මහින්දගේ වේදිකාවේ ද සිටි අයයි.

රනිල් කවදත් තමන්ගේ වේදිකාව සෙලිබ්‍රිටීස්ලාගෙන් පුරවාගෙන අලංකාරවත් කරගත් අයෙක් නොවේ.

ඔහුගේ වේදිකාවේ සැරසිල්ල ඔහුමය. ඔහු කියන දේය, ඔහු කරන දේය.

පසුගිය දිනක රජීව් සෙබස්තියන් මෙසේ සටහනක් තබා තිබුණි.

"අද මම **Cinnamon Grand** හෝටලයට ගියේ මගේ රසිකයෙකු වන **Ivan Perera** මහතාගේ ආරාධනයකට අනුව ඔහුගේ අසූවැනි උපන්දින සාදයේදී ආරාධිත ගායන ශිල්පියෙකු හැටියට ගීත කිහිපයක් ගායනා කිරීම සඳහායි. ඔහුගේ විශේෂ ඉල්ලීමකට අනුව මගේ අවසාන ගීතය වශයෙන් ලෝක පූජිත බටහිර ගායක **Frank Sinatra** ගැයූ **My Way** ගීතය තෝරා ගත්තා.

ගීතය ගයන අතරතුර **Ivan Perera** මහතාගේ යාබද අසුනේ සිටි ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාද **Ivan Perera** මහතා සමඟ රිද්මයට අත්පොළසන් දෙමින් ගීතය රසවිඳින අයුරු මම ඈත තියාම දුටුවා. ගීතය ගයා අවසන් වූ වහාම එහි සිටි සියලුදෙනාම පාහේ මහා හඬින් අත්පොළසන් දුන් අතර **Ivan Perera** මහතා මට ජනාධිපතිවරයා අසුන්ගෙන සිටි මේසය වෙත පැමිණෙන ලෙස අතින් සංඥා කළා. මම එහි ගිය විගස ජනාධිපතිතුමා මගේ ආගිය තොරතුරු විමසූ අතර අප අතරින් වෙන්වූ බටහිර ගායන ශිල්පීන් මෙන්ම පැරණි සංගීත කණ්ඩායම් පිළිබඳවද සුහද සංවාදයක යෙදුණා. අවසන් වශයෙන් සංචාරක ව්‍යාපාරය ඉලක්ක කරගනිමින් මින් පෙර කිසිදාක ලංකාවේ නොපැවති ආකාරයේ සංගීත ප්‍රසංගයක් මේ වසර අගදී පැවැත්වීමට අපි අතර යම් එකඟතාවයක් ඇති වුණා.

මින් පෙර කොතෙක් අවස්ථා ලැබුණත් මෙරට කිසිදු ජනාධිපතිවරයකු හෝ අග්‍රාමාත්‍යවරයකු සමඟ ඡායාරූපයකට පෙනී සිටීමට මට කිසිදු උනන්දුවක් හෝ උවමනාවක් තිබුණේ නැහැ. නමුත් අද දින වත්මන් ජනාධිපතිවරයා සමඟ ඇති වූ වැදගත් සංවාදයෙන් පසු එතුමාගේ සංගීතය පිළිබඳව තිබුණු උනන්දුව සහ දැනුම සම්බන්ධයෙන් මසිතේ උපන් ගෞරවය හේතුවෙන් ජීවිතයේ ප්‍රථම වතාවට ජනාධිපතිවරයකු සමඟ ඡායාරූපයකට පෙනී සිටීමට මම තීරණය කළා"

රජීව් මේ කියන ගීතය, එනම් "I did it, I did it my way" ගීතය රනිල්ගේ පමණක් නොව ඔහුගේ මාමා වූ ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ද ප්‍රියතම ගීතයකි. 77 මැතිවරණ ජයග්‍රහණයෙන් පසු ඔහු සිය උද්දාමය ප්‍රකාශයට පත් කළේ එම ගී පදවලිනි. ඉන් පසු ඔහු සිය පළමු නිල සංචාරයට එක්සත් ජනපදයට ගිය විට, රොනල්ඩ් රේගන් ජනාධිපතිවරයා විසින් සූදානම් කළ රාත්‍රී භෝජන සංග්‍රහයට ෆ්‍රෑන්ක් සිනට්‍රා ද සහභාගී විය. ඒ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා වෙනුවෙන් ඔහුගේ ප්‍රියතම ගීතය වූ "I did it, I did it my way" ගීතය ගායනා කිරීමට ය.

***And now the end is here***
***And so I face that final curtain***
***My friend I'll make it clear***
***I'll state my case, of which I'm certain***
***I've lived a life that's full***
***I traveled each and every highway***
***And more, much more***
***I did it, I did it my way***

***Regrets, I've had a few***
***But then again too few to mention***
***I did what I had to do***
***I saw it through without exemption***
***I planned each charted course***
***Each careful step along the byway***
***And more, much, much more***
***I did it, I did it my way***

***Yes, there were times I'm sure you knew***
***When I bit off more than I could chew***
***But through it all, when there was doubt***
***I ate it up and spit it out***
***I faced it all and I stood tall***
***and did it my way***

***For what is a man, what has he got?***
***If not himself then he has naught***
***Not to say the things that he truly feels***
***And not the words of someone who kneels***
***Let the record shows I took all the blows and did it my way***

අටට වැටී සිටි යූ.එන්.පී.ය ජයග්‍රහණය කරවා I did it යැයි කියන්නටත්, ව්‍යවස්ථා වෙනසකින් තෙමෙම ජනාධිපති වී I did it my way යැයි කිව් ජේ.ආර්. මාමාට වඩා මියැදෙමින් තිබූ රටක් යළි ප්‍රකෘතිමත් කළ නිසා I did it කියන්නට රනිල් බෑණාට අයිතිය ඇත. ඒ අභියෝගයට උර දෙන්නට ඔහු එක් මන්ත්‍රී ධූරයකින් පටන්ගෙන, ජනාධිපති වූයේ ද පෙර නොවූ විරූ ක්‍රමයකට බැවින් I did it my way කියා කියන්නටද ජේ.ආර්. මාමාට මෙන්ම ඔහුටද හැකිය.

වරා

# Mr. President

# IMF වැඩේ ගොඩදාල දෙන එක හර්ෂට බාරදීලා තියෙන්නේ



## සියයට පනහේ කතාව

ජනපති රනිල් වික්‍රමසිංහ ගෙවුණු සති අන්තයේ සිටියේ නුවරඑළියේ ය. දේශපාලන දෙබරයට ඔහු ගලක් විසි කළේ එහි සිටය. ජාතික නීතිඥ සමුළුව අමතමින් ජනපති කීවේ මේ මොහොතේ කිසිදු දේශපාලන පක්ෂයකට 50%ක ඡන්ද ප්‍රතිශතයක් ගත නොහැකි බවය. ජනපති කතාව මාධ්‍ය මගින් ප්‍රචාරය වීමත් සමග එය ලැව් ගින්නක් සේ පැතිර ගියේ විපක්ෂයේ කොටස් අතරය. ජනපති නුවරඑළියෙන් පිටත් වන්නටත් පෙර සිටිම එහි සිටි නීතිඥයින් පවා මේ ගැන විමසන්නට වූවේ දේශපාලනයේ උණුසුම ඔවුනට ද දැනුණු බැවිනි.

"මැතිවරණයෙන් 50%ක් ගන්න බෑ කියපු කතාවට විපක්ෂය කළබල වෙලා. එයාලා ඡන්දය තියන්න කියලා අභියෝග කරනවා." නීතිඥ දිනේෂ් විදානපතිරණ ජනපතිගේ කණේ තැබුවේ එවන් පුවතකි.

"ආණ්ඩු පක්ෂය මේ කාරණය පිළිගත්තත් විපක්ෂය මේ කාරණය පිළිග න්න කැමති නෑ." අසල සිටි නීතිඥයෙකු කීවේය.

"ජනාධිපතිතුමා ආණ්ඩුව මෙහෙයවන්නේ ජනතාව අතර ආණ්ඩුව ගැන විශ්වාසයක් ගොඩ නගලා 50% න් උඩට යන්න." නීතිඥ සුජීවන් හෙන්දාවිතාරණ කීවේ ජනපති දෙස බලමිනි.

"අපි ඉදිරියට යන විදිය ගැන කල්පනා කරද්දී විපක්ෂය හිතන්නේ එයාලා දිනලා කියලායි. අපි අලුත් විදියට හිතද්දී එයාලා තවම අරගලය තියනවා කියලා හිතාගෙන වැඩ කරනවා." නීතිඥ දිනේෂ් ඇත්ත තත්ත්වය පැහැදිලි කළේය.

"1977න් පස්සේ මේ වෙනකම් පාර්ලිමේන්තු ඡන්දයේදී කාටවත් 51% පන්නලා යන්න බැරි වුනා. ජේ.ආර්. වත් හිතුවේ නෑ හයෙන් පහක් ගන්න පුළුවන් වේවි කියලා. තුනෙන් දෙකක බලයක් එදායින් පස්සේ කාටවත් ආවේ නෑ. එහෙම බැලුවම දැන් බලය තියෙන්නේ කාටද කියලා කාටවත් කියන්න බෑ. ස.ජ.බ.ට වත් ජ.වි.පෙ.ටවත් පො.ජ.පෙ.ට වත් කාටවත් මේ 50% ඉක්මවූ බලයක් තියෙනවා කියලා කියන්න බෑ. රටේ ඇත්ත තත්ත්වය ඒකනේ. සාම්ප්‍රදායිකව හිතලා සාම්ප්‍රදායිකව වැඩ කරලා කාටවත් දිනනන්න බෑ." ජනපති කීවේ තරුණ නීතිඥයින්ට උපදේශයක් ද දෙමිනි.

## කොහේ ගියත් අහන්නේ රට ගොඩ දාපු හැටි

"සර් පහුගිය බ්‍රහස්පතින්දා කළ විශේෂ ප්‍රකාශයත්, නුවරඑළියේ කතාවත් ගත්තහම රට ගොඩනගන්න විපක්ෂයට විකල්ප තියෙනවා ද කියන ප්‍රශ්නයක් මතු වෙනවා." තරුණ නීතිඥ දිනේෂ් කියද්දී සැවොම එය අනුමත කළේ ජනපති දෙස බලමිනි.

නීතිඥ සමුළුවෙන් පසු ආර්ථික සමාලෝචනයක් ද පැවැති අතර මේ සියල්ල අවසන් කොට ඉරුදින සවස ජනපති කොළඹ පැමිණියේ රාජකාරී ගොඩ ගැසී තිබුණු බැවිනි. සඳුදා ජනාධිපති කාර්යාලය වෙත ගිය ජනපති රනිල්ට එදින රාජකාරී බහුල දිනයක් වූවේය. මහාධිකරණය සඳහා විනිසුරුවරුන් හතර දෙනෙකු පත් කළේ ඒ අතරතුරදීය.

එදින දහවල් ජනපති රනිල් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තක කරුණාරත්න, ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධනුෂ්ක රාමනායක ඇතුළු මාධ්‍ය නිලධාරීන් පිරිසක් මුණ ගැසුණු අතර ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජාතික ආරක්ෂක උපදේශක සාගල රත්නායක ද ඊට සහභාගී වී සිටියේය.

"ෂැන්ග්‍රිලා ආරක්ෂක සමුළුවේදි යුක්රේන ආරක්ෂක ඇමතිත් මුණ ගැහුණු පින්තූරයක් මම දැක්කා. මොනවද එයා කියන්නේ." ඒ පැනය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාලගෙනි.

"සමුළුවේදී නම් යුක්රේනය ගැන කතා කළා. අපි දෙන්නා නම් කතා කළේ අපේ රටේ විස්තර ගැන. කොහොම වුනත් සමුළුවට ආපු බොහෝ දෙනෙක් මාස කිහිපයකින් රට නැගිට්ටපු විදිය ගැන තමයි කතා කළේ. එයාලා එය හුගක් අගය කළා." සාගල කීවේය.

ජනපති මෙහිදි ආරක්ෂක සමුළුවේ තොරතුරු විමසූ අතර සාගල කීවේ ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂාව සාගර කලාපයේ රටවල් විසින්ම කළ යුතු බවට යෝජනාවක් තමන් ඉදිරිපත් කළ බවය.

"මේක හොද අත්දැකීමක් කලාපයේ රටවල් 22 ක ආරක්ෂක ඇමතිවරු වගේම ජාතික ආරක්ෂක උපදේශකවරු පැමිණ සිටියා." සාගල පැහැදිලි කළේ ආරක්ෂක ඇමතිවරු සමග ඔහුට රාත්‍රී භෝජනයකට ද සහභාගීවීමට ලැබුණු දුර්ලබ අවස්ථාව ද සිහිපත් කරමිනි.

ඇමති මණ්ඩල හමුවට හා ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමට ජනපති සහභාගී වූවේ එදින සවසය. පාර්ලිමේන්තු සතියේ කටයුතු ගැන මෙන්ම ජනපති පාර්ලිමේන්තුවට පැමිණීම ගැන ද එහිදි කතා කළේය.

## එජාපයට අලුත් ව්‍යවස්ථාවක්

අඟහරුවාදා ජනපති ආරක්ෂක සාමාජිකයන් පිරිසක් මුණ ගැසුනේ ජනපති කාර්යාලයේ දී ය. එහිදී රටේ ආරක්ෂාව ගැන මෙන්ම ආගමික සහජීවනය බිඳ වැට්ටවීමට ගන්නා උත්සාහයන් මැඩ පැවැත්වීම ගැන ද කතා කළෝය.

එක්සත් ජාතික පක්ෂ කළමනාකරණ කමිටුව ජනපති මුණ ගැසුනේ එදින සවසය. එහිදී එක්සත් ජාතික පක්ෂ බලමණ්ඩල පිහිටුවීම ජූලි මස මුල් සතිය වනවිට අවසන් කරන ලෙස උපදෙස් දුන් ජනපති රනිල් ඉන් පසු පක්ෂ සම්මේලනය කැඳවීම ගැන ද සාකච්ඡා කළේය. පක්ෂ නව ව්‍යවස්ථාව ගැන විමසා එය පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කොට සම්මත කරගත යුතු බව ද දැනුම් දුන්නේය.

## හර්ෂගේ හා චාලිගේ සම්බන්ධයක් තියෙනවාද?

ජනපති බදාදා පෙරවරුවේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නියෝජිතයන් පිරිසක් මුණ ගැසුණු අතර ස්වභාවික ආපදාවන්හී දි කටයුතු කරන ආකාරය ගැන මෙහිදී කරුණු හුවමරු කරගනු ලැබීය. ඔවුන් හමුවීමෙන් අනතුරුව ජනපති රනිල් කෙළින්ම ගියේ පාර්ලිමේන්තු සංකීර්ණය වෙතය. ජනාධිපති පාර්ලිමේන්තු කටයුතු උපදේශක මහාචාර්ය ආශු මාරසිංහ ජනපතිව කැදවා ගෙන ගියේ මහජන මුදල් කාරක සභාව වෙතය.

මුදල් සම්බන්ධ කාරක සභා 10ක සභාපතිවරු මෙම අවස්ථාවට කැඳවා තිබූ අතර පාර්ලිමේන්තු ප්‍රධාන කාරක සභා කාමරයේදි මෙම හමුව පැවැත්විනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග මුදල් කාරක සභාව ද එකට ගමනක් යා යුතු බව පෙන්වා දුන් ජනපති රනිල් එම කාරක සභාවේ සභාපති ලෙස හර්ෂව පත් කරන බව කීවේ ආණ්ඩුවේ යෝජනාවක් ලෙසිනි.

ඇමරිකානු කොංග්‍රස් සභිකයෙකු වූ චාලි විල්සන් ගැන කතාවක් ජනපති කීවේ මුදල් කාරක සභාවේ මුලසුනේ සිටින අතරවාරයේය. චාලි විල්සන්ගේ කතාව අවසන් කළ ජනපති හර්ෂ දෙස බලමින් චාලි විල්සන්ට වගේ හොඳ ලේකම්වරියක් හර්ෂටත් හොයලා දෙන්න ඕනේ යැයි කියද්දී සභාවම ගිගුම් දුන්නේ සාමාජික මන්ත්‍රීවරුන්ගේ සිනා හඬිනි.

මන්ත්‍රීවරු චාලි විල්සන් ගැන විමසද්දී ජනපති රනිල් එහි ඉතිහාස කතාව කීවේ එය කියවන ලෙස මන්ත්‍රීවරුන්ට පවසමිනි.

"චාලි විල්සන් කියන්නේ ඇමරිකානු කොංග්‍රස් සභිකයෙක්. එයා සෝවියට් ඇෆ්ගනිස්ථාන් යුද්ධය වෙලාවේ ඇෆ්ගනිස්ථානය වෙනුවෙන් පෙනී සිටපු කෙනෙක්. චාලිට ඇෆ්ගනිස්ථානයට යන්න යුද ගුවන් යානක් ඒ කාලේ වෙන් කරලා තිබුණා. හැබැයි එයාට අමතරව එම ගුවන් යානයේ යන්න අවසර තිබුණේ එයාගේ බිරිඳට පමණයි. හැබැයි මෙයා දවසක් එයාගේ ස්ටෙනෝග්‍රපර්වත් එක්ක ගෙන ආවා මේ ගුවන් යානයේ යන්න. එතනදි ගුවන් නියමුවා ඒකට විරෝධය පළ කළා. පස්සේ චාලි ඒ ගමන ගියේ නෑ. ටික දවසකට පස්සේ ගුවන් හමුදාවට ප්‍රහාරක යානා 100ක් ගන්න අනුමැතිය ඉල්ලලා කොංග්‍රසයට ඉල්ලීමක් ආවා. මේ වෙලාවේ චාලි යානා 100ක් වෙනුවට දුන්නේ ගුවන් යානා 75ක් ගන්න අවසරය පමණයි." ජනපති අතීත කතාව කීවත් එය හර්ෂට ගැලපුවේ කෙසේදැයි කාටවත් සිතාගත නොහැකි විය.

"සජිත් අයි.එම්.එෆ්. එකට ඡන්දය දුන්නේ නෑ. අයි.එම්.එෆ්. කොන්දේසි පිළිගන්නේ නෑ කිව්වා. හැබැයි මුදල් කාරක සභාවට ආණ්ඩුවෙන් හර්ෂව පත් කළාට පස්සේ දැන් එයාටත් මේ කොන්දේසි පිළිගන්න වෙනවා." වජිර කීවේ සිනාසෙමිනි.

"ඔව් පක්ෂ විපක්ෂ කවුරු මේ කමිටුවට පත්වුනත් අයි.එම්.එෆ්. ගිවිසුමට සහාය දීලා වැඩ කරන්න ඕනේ. ඇමති ප්‍රසන්න රණතුංග කී විට සැවොම එය අනුමත කළහ.

"අපි හර්ෂට බාරදීලා තියෙන්නේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන බලන්න කියලානේ." ජනපති රනිල් ද ඇඟට පතට නොදැනී කීවේ එම ස්ථානයෙන් පිටත් වන අතරවාරයේය.

## අල්-ජසීරාට වැරදුනාද? වැරැද්දුවාද?

කෙසේ නමුත් ඇදී ඇදී ආ මුදල් කාරක සභාවේ සභාපති ගැටළුව සිය අත්දැකීම් හා පරිණතභාවය පෙන්නුම් කරමින් ජනපති විසඳූ ආකාරය මැති ඇමතිවරු කවුරුත් අගය කරනු ලැබීය. ජනපති රනිල් පාර්ලිමේන්තුවේ සිය කාමරය වෙත යන විට මැති ඇමතිවරු රැසක් එහි පැමිණ සිටි අතර මහාචාර්ය ආශු මාරසිංහ ඔවුන් සියලු දෙනාටම ජනපති මුණ ගැසීමට අවස්ථාව සලසා දුන්නේය.

"මල්ලී පහුගිය ආණ්ඩුව කාලේ මම ඇමති කෙනෙක් වුනත් ජනාධිපති මුණ ගැහෙන්න මට සෑහෙන කාලයක් බලාගෙන ඉන්න සිදුවුනා. හැබැයි ඔයා මෙතනට එන කිසිම මන්ත්‍රීවරයෙකුට ජනපති මුණ ගැසෙන්න නොහැකිව ආපසු හැරිලා යන්න ඉඩ හැදුවේ නෑ." සරත් වීරසේකර මන්ත්‍රීවරයා ආශුගේ පිටට තට්ටුවක් දමමින් කියද්දී රැස්ව සිටි මැති ඇමතිවරු සියලු දෙනා එය හිස සලා අනුමත කළෝය.

බ්‍රහස්පතින්දා පෙරවරුවේ ජනපති රනිල් මුදල් අමාත්‍යාංශය වෙත පැමිණියේ සුපුරුදු ලෙස සතියේ එම දිනය මුදල් අමාත්‍යාංශයේ කටයුතු වෙනුවෙන් වෙන් කරගෙන සිටින නිසාවෙනි.

මෙහිදී ජනපති ලේකම් සමන් ඒකනායක ජනපතිගේ අවධානයට ලක් කළේ අල් ජසීරා රූපවාහිනී නාලිකාව වැරදි පුවත් පළ කිරීමක් ගැනය. එම කාරණය සොයා බලන්නැයි ජනපති ලේකම් පැවරුවේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තක වෙතය.

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ විරෝධතා පෙළපාලිය මැඩ පැවැත්වීමට පොලිසිය කටයුතු කරද්දී කමාන්ඩෝ සෙබළුන් සිටින බවට හා පැරණි දර්ශන සජීව දර්ශන ලෙස ප්‍රචාරය කිරීම ගැන තමන් එහි ප්‍රධාන කාර්යාලය වෙත පැමිණිලි කරන බව ජනපති ජාත්‍යන්තර කටයුතු අධ්‍යක්ෂ දිනුක් කොළඹගේ කීවේය. ඒ අනුව දිනුක් කොළඹගේ හා ජනාධිපති උපදේශක ක්ෂෙනුකා සෙනවිරත්න විසින් අදාළ ලිපිය සකස් කොට අල් ජසීරා ප්‍රධානීන් වෙත එදිනම යොමු කර තිබුනි.

## දොලවත්තගේ පනතට මාලිමාවත් පක්ෂයි?

පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොලවත්ත ගෙනා සමරිසි අයිතිවාසිකම් පනත් කෙටුම්පතට සහාය දෙමින් පසුගිය දා කොළඹ දී පැවැති පෙළපාලියට ජාතික ජන බලවේගයේ කොළඹ නගරාධිපති අපේක්ෂිකාව ද එක්ව සිටීම ගැන මෙහිදි කතාබහට ලක්වූවේය.

"ලංකාවේ මේ පෙළපාලිය ගියේ ජාත්‍යන්තර පෙළපාලිය යන්න ඉස්සෙල්ලා. ජාත්‍යන්තර පෙළපාලියට ලොකු මුදලක් ලැබෙනවා. ඒක මේ පක්ෂයේ අයට ගෙන්න ගන්න ද දන්නේ නෑ මෙහෙම පෙළපාලි යන්නේ." මන්ත්‍රී මධුර විතානගේ කී විට සැවොම එකිනෙකාගේ මුහුණ බලාගත්හ.

ජනපති එදින සවස ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ගබඩාකිරීම, බෙදාහැරීම සහ විකිණීම සඳහා දිගුකාලීන ගිවිසුමකට අත්සන් තැබීමේ අවස්ථාවට එක්වූවේ ජනාධිපති ලේකම් කාර්යාලයේදීය. අඛණ්ඩ තෙල් සැපයුමක් වෙනුවෙන් ඇමරිකානු තෙල් සමාගම සමග මෙම ගිවිසුමට අත්සන් කරනු ලැබූවේ ඛනිජතෙල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අයි.එම්. පාර්ක් සමාගමේ උපසභාපතිවරයා විසිනි.

Mediaman

# දේශපාලන පරිවර්තන යුගයකට මග හදන ජන සභා



ශ්‍රී ලංකාවේ දේශපාලනය අනාදිමත් කාලයක සිට පැවැතියේ සාමාන්‍ය ජනතාවට ඉහළින්, සමීප විය නොහැකි තරම් දුරකින් සිටි ප්‍රභූ පැලැන්තියක උරුමයක් ලෙසය. ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් පිහිටවූ රට ලෙස ශ්‍රී ලංකාව පැවැතියත් මේ ආණ්ඩු කෙරුවාව ජනතා සහභාගිත්වයෙන් තීන්දු තීරණ ගන්නා තැනක් වූයේ නැත. ජනතාව එයින් ඈත් කරවීමේ දේශපාලන ජඩකම් හැමදාම සිදු විය. එහි කෙලවරක් විය යුතු බවට ජනතාව වෙතින් විශාල හඬක් පැන නැගුනේ පසුගිය අරගල සමයේදීය. දෙසිය විසිපහම එපා.., පාර්ලිමේන්තුවෙන් පිටත මහජන බලයක් ගොඩනැගිය යුතුය.. ආදී වශයෙන් වූ සටන් පාඨවලට වලංගු භාවයක් ලැබුණේ ඒ අනුවය. මෙම ගැටලුව මෙරට තුළ පැන නගින බව කාලන්තරයක් තිස්සේ සාකච්ඡාවට බඳුන් වෙමින් ද තිබිණි. එක් එක් කාලවල ජනතාවගේ සහභාගීත්වය ආණ්ඩුකරණයට සමීප කරවීම වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග වූවද ඒවා හිතු තරම් සාර්ථක වුයේ නැත. නැතිනම් සාර්ථක වන්නට ප්‍රභූ දේශපාලනය විසින් ඉඩ තැබුවේ නැත.

අරගල සමයත් සමඟ පැන නැගුනු තත්වයන් විසින් මේ වෙනුවෙන් නව යෝජනා ඉදිරිපත් විය. විශේෂයෙන්ම සාධාරණ ජන සමාජයක් වෙනුවෙන් වන ව්‍යාපාරය විසින් මේ වන විටත් ඉන්දියාවේ ක්‍රියාත්මක ජනසභා ක්‍රමයට සමීප යෝජනාවක් ගෙන අවේ ඒ අනුවය. සාමාන්‍ය ජනතාවගේ අදහස් සාකච්ඡා කොට ඒවා සම්බන්ධයෙන් දේශපාලන මැදිහත්වීමක් සඳහා වන ව්‍යුහයක් ගොඩනැගිමේ මෙම ජන සභා ක්‍රමය පිළිබඳ යෝජනාව ජනාධිපති රනිල් වික්‍රමසිංහ වෙත ඉදිරිපත් කරන ලදුව ඊට කැබිනට් අනුමැතියද හිමි විය. ඒ අනුව එම වැඩපිළිවෙල මෙරට නීතියක් බවට පත් කිරීමට අදාල පනත් කෙටුම් පත ඉදිරි දින කිහිපය තුළදි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කිරීමට නියමිතව ඇත. එමෙන්ම මේ වන විටත් ජන සභා ක්‍රමය සංවර්ධනය කිරීමත් එම ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමත් අරමුණු කරගෙන ජාතික ජන සභා ලේකම් කාර්යාලය පිහිටුවා ඇති අතර එහි නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද ආරම්භ කර ඇත.

කොහොම නමුත් අතීතය තුළත් ජන සභා ක්‍රමයට සමීප ආකෘති කිහිපයක්ම මෙරට ක්‍රියාත්මකව තිබු නමුත් ඒවා දිර්ග කාලිනව පවත්වාගෙන යාමට නොහැකි විය. ඊට හේතුවක් වුවේ රටේ සංවර්ධන ගමනට සමගාමීව යාවත්කාලීන වෙමින් එම ව්‍යුහයන් සංවර්ධනය කරගැනීමට නොහැකිවීම හා විවිධ දේශපාලනික වුවමණාවන් මත සිදු කෙරුණු ක්‍රියාමාර්ග නිසා ඒ අහෝසි වෙන තැනට කටයුතු සිදු වීමය.

එලෙස අතීතයේ ශ්‍රී ලංකාවේ පැවැති ගම් සභා ක්‍රමය ජනතාවට සමීප වු ප්‍රාදේශිය යහපත් ආණ්ඩු ආකෘතියක් විය. නියෝජිත මැතිවරණ මූලධර්ම පදනම් කරගෙන එය ක්‍රියාත්මක වූ නමුත් 1980දී එය අහෝසි කර ඒ වෙනුවට 1991දී ප්‍රාදේශීය සභා ක්‍රමය ක්‍රියාත්මක කෙරිණි. මේ වන විට ප්‍රාදේශිය සභා ක්‍රමයද අසාර්ථක සහ දූෂිත ආයතන පද්ධතියක්ව ජනතාවගෙන් දුරස් වී ඇත. මේ තත්වය මත යළි පැරණි ගම්සභා ක්‍රමයට සමාන දේශපාලන ක්‍රමවේදයක් ලෙසත් "ජනසභා" ක්‍රමය ඉස්මතුව ඇත. නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන්නේ ආණ්ඩුකරණයට ජනතාව හැකි තරම් සහභාගී කර ගැනීමය. නමුත් මෙය ශ්‍රී ලංකාවය අලුත් දෙයක් නොවේ.

මෙරට දීර්ග කාලයක් රජකම් කළ පණ්ඩුකාභය රජු සාමන්‍යයෙන් හැඳින්වෙන්නේ මහජන සම්මතයෙන් රජකමට පත් වූ සහ මහජන සහභාගිත්වය සහිත පාලනයක් පවත්වා ගෙන ගිය රාජ්‍ය සමයක් ලෙසය. එම රජ සමයේ ගම් සභා ක්‍රමයක් පවත්වාගෙන ගොස් ඇත. මේ පිළිබඳ මූලාශ්‍ර උෟව පළාතේ දොඹගහවෙල, රුහුණු ජාතික උද්‍යානය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන වැනි දිවයිනේ විවිධ ප්‍රදේශවලට සම්බන්ධ ශිලා ලේඛනවලින් හමු වී තිබේ.

නිදහසෙන් පසු යුගයේදී සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් යෝජනා 1955 චොක්සි කමිටු වාර්තාව, 1968 ජයසූරිය කමිටු වාර්තාව, 1970 සිත්තම්පලම් කමිටු වාර්තාව, 1979 මොරගොඩ කමිටු වාර්තාව, 1980 වික්ටර් තෙන්නකෝන් කමිටු වාර්තාව සහ 1986 එච්.ඒ.පී. අභයවර්ධන කමිටු වාර්තා යන වාර්තා සියල්ලේ ම පාහේ අන්තර්ගතව තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව සිදු කරන ලද 1999 ජනාධිපති කොමිෂන් සභා වාර්තාව තුළ ද සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීමේ වැදගත්කම ඉස්මතු කර තිබේ.

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා ගන්නා ලද තවත් වැදගත් උත්සාහයක් වන්නේ 1981 ජූලි මස 01 වැනිදා ආරම්භ කරන ලද දිස්ත්‍රික් සංවර්ධන සභා හඳුන්වා දුන් දිස්ත්‍රික් සංවර්ධන සභා පනතයි. එම පනතේ 17 වන වගන්තියෙන් ග්‍රාමෝදය මණ්ඩල හඳුන්වා දෙන ලදි. බිම් මට්ටමේ ජනතාවගේ සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා සංවර්ධන සභාවලට අතිරේකව ප්‍රාදේශීය මණ්ඩල සහ ග්‍රාමෝදය මණ්ඩල පිහිටුවන ලදි. එමෙන්ම 2016 වසරේදී එළිදක්වන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳව මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාවෙන් ද ග්‍රාම රාජ්‍ය සංකල්පය පිළිබඳව සාකච්ඡා කර ඇත.

## වත්මන් ජනසභා ක්‍රමය යනු කුමක් ද?

ජනසභා ක්‍රමය යනු ගමක මිනිසුන්ට තමන්ගේ ගමේ සංවර්ධනය සිදුවිය යුතු ආකාරය තමන්ටම තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන ක්‍රමවේදයකි. සෑම ගමකම ගොඩනැගෙන ජනසභාවට තමන්ගේ ගමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති මොනවදැයි තීරණය කිරීමටත් එවැනි ව්‍යාපෘති ප්‍රමුඛතා අනුව පෙළගස්වා නිසි කාල රාමුවක් තුළ රජය මඟින් ඉටු කර ගැනීමටත් අවස්ථාව ලැබේ. එපමණක් නොව, සුබසාධන සහන අවශ්‍යතා ඉටු කිරීමටත්, මහජන ගැටලු වඩා සාධාරණ ක්‍රමවේදයකට විසඳා ගැනීමටත්, ජනසභා ක්‍රමය තුළින් ජනතාවට අවස්ථාව ලැබේ.

ලංකාවේ ඈත අතීතයේ සිටම ගම් මට්ටමේ තීන්දු තීරණ ගැනීමේ විවිධ යාන්ත්‍රණයන් පැවතිණ. එය කාලයක් තිස්සේ ක්‍රියාත්මක වී නතර වුණු ගම් මට්ටමේ තීන්දු තීරණ ගැනීමේ යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු සහ දුර්වලතා හඳුනාගෙන ඒ දුර්වලතා මඟහරවා ජනතාවට සක්‍රීයව සහභාගී විය හැකි වඩාත් සුමට ක්‍රමයක් ලෙස මෙම යෝජිත ජනසභා ක්‍රමය ඉදිරිපත් කර ඇත. මෙම ජනසභා ක්‍රමය මෙන් ජන සහභාගීත්ව ක්‍රම අසල්වැසි ඉන්දියාව, අයර්ලන්තය, ඉන්දුනීසියාව ඇතුළු ලොව බොහෝ රටවල සාර්ථකව ක්‍රියාත්මක කෙරේ.

## ජන සභා ක්‍රමයේ මූලික අරමුණු

සියලුම ශ්‍රී ලාංකිකයන්ට කිසිදු අයුරකින් වෙනස්කොට සැලකීමට ලක් නොවී ගම පිළිබඳව, තමාගේ රට පිළිබඳව, ප්‍රතිපත්ති සම්පාදනයට දායකවීම සඳහා සමාන ඉඩප්‍රස්ථා සහිත සම බිමක් නිර්මාණය කිරීමට අවශ්‍ය පදනම සැකසීම ජනසභා ක්‍රමයේ මූලික අරමුණක්ව තිබේ.

## ජන සභාව හැදෙන්නේ කොහොමද ?

ග්‍රාම සේවා නිලධාරී වසමක ජීවත් වන වයස අවුරුදු 16ට වැඩි සියළු දෙනාගේම එකමුතුවෙන් ගමේ ජන සභාව නිර්මාණය කෙරෙයි.

## ජන සභාවට මොනවද කරන්න පුළුවන්?

ග්‍රාම සේවා වසමට අදාලව පවතින භෞතික, මානව, ස්වභාවික සහ වෙනත් සම්පත් හඳුනා ගනිමින් ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගැනීම.

ග්‍රාම සේවා වසමට අදාලව පවතින සුබසාධන සහන අවශ්‍යතා හඳුනා ගැනීම හා එම සහන බෙදා දිය යුතුවඩාත් සාධාරණ හා යුක්ති සහගත ප්‍රමුඛතාව නිරීක්ෂණය කිරීම.

ග්‍රාම සේවා වසමට අදාලව පවතින මහජන දුක්ගැනවිලි කළමනාකරණය සඳහා මැදිහත්වීම.

## ජන සභාවට බලයක් තියනවාද?

මෙම ජනසභා ක්‍රමය ඉදිරියේ දී පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය වීමට නියමිතයි. ඒ අනුව ග්‍රාමීය කටයුතු සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදනයට ජනසභාවට විශාල බලයක් හිමි වේ. එමෙන්ම අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට ග්‍රාමීය කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ජන සභාව සමඟ සහයෝගීව කටයුතු කරන්න අවස්ථාව ලැබේ.

## ජනසභාවේ ග්‍රාමීය සැලසුම් ක්‍රියාත්මකවීම

ජනසභාවේ මිනිසුන් එකතුව හදන ජනතා සැලසුම් ක්‍රමානුකූලව ඉහළට ගලාගෙන යන විධිමත් ක්‍රමවේදයක් ජනසභා ක්‍රමයෙන් ගොඩ නැගෙයි. මේ නිසා ගමේ ජනතාවගේ සැබෑ සංවර්ධන සහ සුබසාධන අවශ්‍යතා වගේම ඉල්ලීම් ඉටු කරගන්න තව දුරටත් රස්තියාදුවෙන්න අවශ්‍ය නෑ. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පළාත් සභා සහ රාජ්‍ය අමාත්‍ය යන ආයතන මට්ටමෙන් මෙම ජනසභා ක්‍රමය තුළින් මතුවන සංවර්ධන සැලසුම්, ප්‍රතිපත්ති, යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමක් සහිත ක්‍රමවේදයක් සහිත කමිටු ක්‍රමයක් යෝජනාකොට තිබේ.

## ග්‍රාමීය ප්‍රභූවාදය අවසන් කිරීම

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත ජනසභා පනත් කෙටුම්පත මගින් යෝජනා කරන ජන සභා ක්‍රමය මගින් පරිධියේ ජනතාව තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගීවීම වලක්වන පහත පවුරු පදනම් වලින් ඔවුන් මුදා ගැනීමට අපේක්ෂා කරයි. ඒවා නම්;

1. *ග්‍රාමීය ප්‍රභූවාදය*
2. *ප්‍රදේශීය දේශපාලන අධිකාරීවාදය*
3. *නිලධාරීවාදය*

යන පවුරු පදනම් ත්‍රිත්වයයි.

මේ අනුව වරප්‍රසාදිත තත්වයන්ගෙන් තොරව ජනතාවට සමානාත්මතාවයෙන් යුතුව පහත සඳහන් කාර්යයන් සඳහා සහභාගීවීමට යෝජිත ජනසභා ක්‍රමය මගින් ඉඩප්‍රස්ථාව සලසා දීමට නියමිතය. ඒවා නම් ;

1. *ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය*
2. *ග්‍රාමීය සංවර්ධන ප්‍රමුඛතා තීරණය කිරීම*
3. *ග්‍රාමීය සම්පත් හඳුනාගැනීම*
4. *ග්‍රාමීය සුබ සාධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ සුබ සාධන ප්‍රමුඛතා තීරණය කිරීම*
5. *ග්‍රාමීය මහජන දුක්ගැනවිලි අදාළ අධිකාරීන් වෙත යොමු කරවීම සඳහා මැදිහත්වීම*

## ජනසභා ක්‍රමයේ ලක්ෂණ

සෑම ග්‍රාම සේවා වසමකටම එක් ජනසභාවක්.

වයස අවුරුදු 16 ට වැඩි සියලු දෙනාට ජනසභාවට සහභාගීවීමේ අවස්ථාව.

5-ත් 25 ත් අතර සංඛ්‍යාවකින් යුත් කාරක සභාවක් කාරක සභා සාමාජිකයින් ස්වේච්ඡා පදනමින් ධූරයන් දැරිය යුතුයි.

කාරක සභාව තුළ 30% ක කාන්තා හා 25%ක තරුණ ඉඩප්‍රස්ථා සහතක කිරීමක්.

කාරක සභාව තෝරා ගැනීම ජනසම්මුතියෙන් හෝ ලොතරැයි ක්‍රමයකින් ග්‍රාමසේවා වසමකටම අදාළ නිලධාරීන්ගේ උපරිම දායකත්වය ජනසභාවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා ලබා ගැනීම වෙනුවෙන් සෑම වසමකටම නිලධාරී කමිටුවක්.

ජනසභා ක්‍රමය විධිමත්ව පවත්වාගෙන යාම නියාමනය හා අධීක්ෂණය සඳහා ස්වාධීන කොමිසම් සභාවක්.


## ජනසභා ලේකම් කාර්යාලය

ජාතික ජනසභා ලේකම් කාර්යාලය ජනසභා පිහිටුවීම අධීක්ෂණය සහ ප්‍රවර්ධනය පිළිබඳ වගකීම දරන ප්‍රධාන ආයතනයයි. එය සම්පූර්ණයෙන් ස්වාධීන ආයතනයක් වන අතර එමගින් පාර්ලිමේන්තුව හා ජනාධිපති කාර්යාලය අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යනු ලබයි. එමෙන්ම සියලුම ග්‍රාමීය ජනසභා ලේකම්වරුන් අධීක්ෂණය, සුපරික්ෂණය සහ පුහුණුව පිළිබඳ වගකීමද හිමිවන්නේ එම ආයතනයටය.

මේ අනුව මෙරට සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් ස්ථාපිත කරන ජනසභා ක්‍රමය මෙරට දේශපාලනයේ නව පරිවර්තන යුගයකට මග පාදනු ඇත. එමෙන්ම මේ වන විට 2048 ඉලක්ක කර ගත් ආර්ථික සංවර්ධන වැඩපිළිවෙලට මෙරට සියළු පුරවැසියන් දායක කරගැනීමත් එය පුරවැසි වගකීමක් බවට පත් කිරීමත් මේ ජනසභා ක්‍රමයෙන් සිදු වෙනු ඇත.

රිද්ම අනුරාධ ගමගේ

# වල්බුරු මාධ්‍ය නිදහස රටට සාපයක්




විද්‍යුත් මාධ්‍ය නියාමනය වෙනුවෙන් නව නීති පැනවීමක අවශ්‍යතාවය දශක ගණනාවක් පුරා පැවැති නමුත් ඒ මෙතෙක් ක්‍රියාත්මක වුයේ නැත. ඒ වෙනුවෙන් **"විකාශන නියාමන පනත"** නමින් මූලික සාකච්ඡාවක් සඳහා කැබිනට් අනුමැතිය ලත් දළ සටහනක් පදනම් කරගනිමින් මේ වන විට ආණ්ඩු විරෝධී බොහෝ දෙනා ආණ්ඩුවට එරෙහිව විරෝධය ගොනුකරමින් සිටී. ඔවුන් සියලු දෙනාගේ මේ හැසිරීම දෙස විමසුමකින් බැලීමේදී පැහැදිලි වනුයේ, අදාළ අරමුණ පසෙකලා පුද්ගලික අරමුණු වෙනුවෙන් මෙය භාවිත කරන බවකි. ලොව ප්‍රසිද්ධ කර්තෘවරයකු වූ ක්‍රේග් ග්‍රෝෂෙල් විසින් සටහන් කළ පරිදි **"යම් දෙයක අරමුණ ඔබ නොදන්නේ නම්, ඔබට කළ හැක්කේ එය වැරදි ලෙස භාවිතා කිරීමයි"** යන්න ඔවුන් සියලු දෙනා මනාව ඔප්පු කරමින් සිටී. වඩාත් නිවැරදිව තේරුම් ගන්නේ නම්, ඒ විකාශන නියාමනයට අදාළ සාකච්ඡාවේ අරමුණ පිළිබඳ මනා දැනුවම්වත්භාවයකින් යුතුව එය නොසලකා ආණ්ඩු විරෝධීව හුදු පුද්ගලික දේශපාලන අරමුණකින් ඊට මැදිහත්ව සිටින බවය.

## පසුබිම් කතාව

විද්‍යුත් විකාශන නියාමනය සඳහා වූ නීති සම්පාදනය කළයුතු බවට වන අවශ්‍යතාව සපුරා ගැනීම වෙනුවෙන් ජනමාධ්‍ය අමාත්‍යවරයා, කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කළ අතර එය 2022 සැප්තැම්බර් 09 දින කැබිනට් මණ්ඩලය සම්මත කළේය. ඒ අනුව විද්‍යුත් විකාශන නියාමන පනත සඳහා කෙටුම්පතක් සැකසීමට කැබිනට් අනුකමිටුවක් පත්කරන ලදී. එහි ප්‍රධානත්වය අධිකරණ අමාත්‍යවරයා දරණ අතර ඔහුගේ මූලිකත්වයෙන් සකසන ලද මූලික සංකල්ප පත්‍රිකාවක්, අදහස් හා යෝජනා ගොනුකර ගැනීම සඳහා විද්‍යුත් විකාශකයන්ගේ සංගමය වෙත යොමුකර තිබේ. එය කිසිසේත්ම මේ සම්බන්ධ අවසන් ලියවිල්ල හෝ පනත් කෙටුම්පත හෝ නොවන බව ද අධිකරණ අමාත්‍යවරයාම පුන පුනා පවසා ඇත.

## මූලික සංකල්ප යෝජනා

1. *විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම*
2. *යෝජිත කොමිසම මගින් විද්‍යුත් විකාශන අන්තර්ගතය නියාමනය කිරීම*
3. *විද්‍යුත් විකාශන ආයතන බලපත්‍ර අත්හිටුවීම හෝ අහෝසි කිරීමේ බලය අදාළ කොමිසමට පැවරීම*
4. *දැනට පවතින සියලු විද්‍යුත් විකාශන ආයතන විසින් විකාශන බලපත්‍ර නැවත ඉල්ලීමේ ක්‍රියාවලියකට කැඳවීම*
5. *සෑම බලපත්ලාභී විද්‍යුත් විකාශන ආයතනයක්ම වාර්ෂිකව බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම*
6. *විද්‍යුත් විකාශන ආයතනවල අන්තර්ගතය පරික්ෂා කිරීමට පැමිණිලි විමර්ශන කමිටුවක් පත් කිරීම*
7. *බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නියෝග පැනවීමට විෂයභාර අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව සමග ප්‍රතිපාදන සම්පාදනය කිරීම*
8. *කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධ විධිවිධාන සඳහා කොමිෂන් සභාවට රීති පැනවීමට බලය පැවරීම*
9. *දඩ සහ සිර දඬුවම් නියම කළ හැකි වැරදි හඳුන්වාදීම*

ඒ විද්‍යුත් විකාශන නියාමනය සඳහා අමාත්‍ය අනුකමිටුව විසින් ඉදිරිපත් කරන ලද මූලික යෝජනාය. එය හුදෙක් අදහස්, සාකච්ඡා පිණිස ඉදිරිපත් කළ දෑ මිස අදාළ පනත සඳහා වූ අවසන් තීරණ නොවේ. ජන මාධ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නීතියක් පැනවෙද්දී එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, අනෙකුත් අණ පනත්වලට, මාධ්‍ය නීති සහ ආචාර ධර්මවලට, ලෝකයේ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල ක්‍රියාත්මක නීති රීති සම්ප්‍රදායයන් ආදිය සලකා බලා අදාල පනත් කෙටුම් පත සැකසීම සිදුවේ. අනතුරුව එය ගැසට් කර විරෝධතා සහ නව යෝජනා ආදියට ඉඩ සලසා දෙන අතර අධිකරණයේ අර්ථ නිරූපනයන්ට ද යා හැකිය. පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒ තුළ වන වාද විවාදවලින් අනතුරුව යළි සංශෝධනයන්ට ගොස් එය බහුතර ඡන්දයෙන් සම්මතවීමෙන් පසුව රටේ නීතිය බවට පත්වේ. එය එසේ තිබිය දී අද බොහෝ ආණ්ඩු විරෝධීන් මෙම යෝජනාව සම්බන්ධයෙන් බරපතල චෝදනා ඉදිරිපත් කර සමාජය තුළ පදනම් විරහිත ආණ්ඩු විරෝධයක් නිර්මාණය කිරීමට උත්සාහ දරනු විනා අදාළ කාර්ය සාර්ථක කරගැනීම වෙනුවෙන් වූ කිසිඳු යෝජනාවක් ඉදිරිපත් කරන බවක් ද දක්නට නැත.

විපක්ෂ නායකවරයා මේ සම්බන්ධයෙන් පවසා ඇත්තේ, විකාශන නියාමන පනත හරහා විකාශන නියාමන කොමිසමක් ස්ථාපිත කර රටේ මාධ්‍ය මර්දනය හා ප්‍රජාතන්ත්‍රවාදය මංකොල්ල කෑමට රජය උත්සාහ දරන බවය. එසේම විදෙස්ගතව සිට මෙරට දේශපාලනය සම්න්ධයෙන් ලිපි ලියන මාධ්‍යවේදියකු සඳහන් කර ඇත්තේ, මෙම පනත හුදෙක් රූපවාහිනී හෝ ගුවන් විදුලි සේවාවන්ට බලපාන එකක් පමණක් නොව සමස්ත සමාජයේම ගෙල හිර කරන මළ පුඩුවක් බවය. මේ චෝදනා හුදු දේශපාලනික වුවමනාවන් මත ගොඩනගන ලද වෛරීසහගත ප්‍රකාශයන්ය. නමුත් නියාමනය යනු වාරණයක් නොවන බව ඔවුන් නොදන්නවා විය නොහැක. එම නිසා අදාළ කෙටුම්පත් යෝජනා කවරකින් වුව සමාජයේ ඉදිරි ගමනට හෝ පැවැත්මට කිසියම් හෝ හානියක් වන්නේ නම්, ඒ සඳහා සුදුසු යෝජනා ඇතුළත් කිරීමට අදහස් උදහස් ඉදිරිපත් කළ හැකිය. ඒ සඳහා විවෘතය. අවශ්‍ය වන්නේ, සමාජ ප්‍රගමනයට ඉවහල්වන අයුරින් අදාළ කටයුතු සඳහා මැදිහත්වීම මිස කුහකත්වයෙන් එය පාගා විනාශ කිරීම නොවේ.

## නියාමනය කුමක් සඳහා ද?

මෙරට ගුවන්විදුලි සහ රූපවාහිණී යන විද්‍යුත් විකාශනයන් පිළිබඳව සැලකිය යුතු ඉතිහාසයක් තිබේ. මෙම විකාශනයන් සඳහා අවශ්‍ය ගුවන් විදුලි තරංග වෙන් කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් සිදු කෙරේ. නමුත් අප රට තුළ ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවය සහ ජාතික රූපවාහිණියට අදාළ අණපනත් ඇති නමුත් අන් කිසිඳු ගුවන්විදුලි හෝ රූපවාහිණී නාලිකා හිමිකාරීත්වය පැවරීම හෝ විකාශන අන්තර්ගතය සම්බන්ධයෙන් වූ පනත් සම්පාදනය වී නොමැත.

ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 44 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හැර වෙනත් ගුවන්විදුලි විකාශනයක් පවත්වාගෙන යාම සඳහා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 28 වගන්තියට අනුව ශ්‍රී ලංකා රූපවාහිනිය හැර වෙනත් පෞද්ගලික රූපවාහිනී හෝ ගුවන්විදුලි විකාශනයක් පවත්වාගෙන යාම සඳහා ද විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලත් විකාශන බලපත්‍රයක් ලැබිය යුතුය. මෙතෙක් සිදුව ඇත්තේ ද එයමය. ඒ අනුව ඇමැතිවරයාගේ හිතවත්කම මත, අල්ලසකට වුව එය ලබා ගැනීමේ හැකියාව ඇත. මෙම විකාශනයන් සඳහා අවශ්‍ය ගුවන්විදුලි තරංග වෙන් කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් සිදු කෙරේ. එය බොහෝ විටම පැවැතියේ ජනාධිපතිවරයා යටතේය. ඒ අනුව කාලෙන් කාලයට රූපවාහිණී විකාශයන් සඳහා අදාල බලපත්‍ර සහ ගුවන්විදුලි තරංග වෙන් කිරීම දේශපාලනික හෝ පෞද්ගලික ලැදියාවන් අනුව සිදුව තිබෙන බව පැහැදිලිය. එසේම මෙම තත්වය මත විද්‍යුත් මාධ්‍ය ආයතනවලට දේශපාලනික බලපෑම් එල්ලවීමද සිදුව තිබේ.

එහෙත් සුදුසු විද්‍යුත් මාධ්‍ය හිමිකරුවන් තෝරා ගැනීමේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය විය යුත්තේ, ආණ්ඩුවේ හෝ දේශපාලනික හා ව්‍යාපාරික බලපෑම්වලින් තොරව ස්වාධීන විකාශන අධිකාරියක් මගින් නිසි නිර්ණායකවලට අනුව පාරදෘශ්‍ය ලෙස තෝරා ගත් සුදුසුකම් ලත් ඉල්ලුම් කරුවන්ට විද්‍යුත් මාධ්‍ය විකාශන බලපත්‍ර ලබා දීමයි.

එසේම විකාශන තරංග වෙන් කිරීම සහ විකාශන බලපත්‍ර ලබාදීමට ආයතන පැවතියද විද්‍යුත් මාධ්‍ය විකාශනයන්හි අන්තර්ගතය නියාමනය කිරීම සඳහා බලය පැවරුණ කිසියම් හෝ ආයතනයක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත හෝ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත මගින් ප්‍රතිපාදන සම්පාදනය කොට නැත. එබැවින් විද්‍යුත් විකාශනයන්ගේ අන්තර්ගතය නියාමය සඳහා බලය පැවරුණ ආයතනයක අවශ්‍යතාවය මෙරට විද්‍යුත් විකාශන ආරම්භයේ පටන් තිබූ අත්‍යවශ්‍ය කාරණයකි.

ලොව පුරා සෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක්ම ගුවන්විදුලි හෝ රූපවාහිනී විද්‍යුත් මාධ්‍ය විකාශන පවත්වා ගෙන යාමට අවශ්‍ය බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ, මහජන යහපත පදනම් කරගත් කොන්දේසි ප්‍රකාරව පැනවූ නීති මත නියම කරන ලද නියාමන විධි ක්‍රමයකට යටත්වය. එහෙත් එකී නියාමය සිදු කළ යුත්තේ බලයේ සිටින ආණ්ඩුව හෝ ආණ්ඩුවේ ආයතනයක අභිමතයට යටත්ව නොව ඒ සඳහා විශේෂයෙන් පිහිටුවනු ලබන ස්වාධීන විකාශන නියාමන අධිකාරියක් හරහාය. එයද ජාත්‍යන්තරව පිළිගත් විකාශන නිර්ණායකවලට ද අනුකූලවය. මෙවැනි ස්වාධීන අධිකාරියක් මගින් විද්‍යුත් මාධ්‍ය නියාමනයක් සිදුකළ යුත්තේ ඇයි ද? යන ගැටළුවට පෙන්වා දිය හැකි හේතු බොහොමයකි.

මූලිකවම විකාශන සංඛ්‍යාත යනු මහජනයා සතු සීමිත ස්වාභාවික සම්පතකි. එම නිසා විකාශන සංඛ්‍යාත පෞද්ගලික අයිතියට සින්නකරව පැවරිය හැකි දේපළක් නොවේ. එය බලපත්‍රයක් මගින් නියම කරන කොන්දේසිවලට අනුව සේවා සැපයීම පිණිස තෝරා ගත් ආයතන හා සමාගම්වලට හෝ හිමිකාරීත්වයකට නිශ්චිත කාලයක් උපයෝජනය පිණිස පවරනු ලබන මහජන දේපලකි.

එසේම පොදු මහජන දේපලක් වන විද්‍යුත් සංඛ්‍යාත භුක්ති විඳිමින් සහ ඒ ඔස්සේ ලාභ ලබමින්, අවිචාරී මාධ්‍ය භාවිතයක යෙදෙන බවට දශක දෙකකට වඩා වැඩි කාලයක් පුරා එල්ලවන සහේතුක චෝදනාවෙන් මේ රටේ කිසිදු විද්‍යුත් මාධ්‍යයකට ගැලවීමක් නැත. එසේම **"වගකීම් විරහිත මාධ්‍යකරණය"** යන්න නොලසකා බැහැර කළ නොහැකි බරපතල චෝදනාවක් ද වෙයි.

## වගකීම් විරහිත මාධ්‍යකරණය

මුද්‍රිත මාධ්‍ය යනු පාඨකයාගේ රුචිකත්වය හෝ වෙනත් කුමන හෝ අවශ්‍යතාවයක් මත මිලදී ගැනීමකින් පසු එක් එක් පුද්ගලයා ග්‍රහනයට නතුවන මාධ්‍යයකි. නමුත් විද්‍යුත් මාධ්‍ය යනු එක් නිමේෂයකින් විශාල ජනගහණයක් සජීව ග්‍රහණයට ගෙන අදාළ ප්‍රචාරණයන් සිදුකළ හැකි මාධ්‍යයකි. ඒ අනුව ගත්කළ විශාල ජන සංඛ්‍යාවක් එකවර කිසියම් කරුණක් සම්බන්ධයෙන් පොළඹවා ගැනීමට විද්‍යුත් මාධ්‍යට ඇති මේ හැකියාව අතිශය තීරණාත්මක වේ. නමුත් මෙරට විද්‍යුත් මාධ්‍යකරණය සම්බන්ධයෙන් පොදු අත්දැකීම නම් අතිශය බහුතරයක් විද්‍යුත් මාධ්‍ය විකාශනයන් තුළ විශ්වසනීයත්වය (Reliability) සාධාරණත්වය (Fairness)සහ අපක්ෂපාතීත්වය (Impartiality) තහවුරු කිරීමට වඩා අදාළ මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ අභිමතය සමාජගත කිරීමට යොදාගන්නා බවය.

ඒ සඳහා ආසන්නතම උදාහරණ ලෙස, ජාතිවාදී ආගම්වාදී කල්ලි කණ්ඩායම්වල වුවමනාවන් මත වෛද්‍ය ෂාෆිට ජාතිද්‍රෝහියකු කිරීම, මැතිවරණයක් ආසන්න කාලයේ එක් පාර්ශ්වයකට පක්ෂපාතීව නාගලෝකයෙන් නයි ගෙන්වීම, රටම ව්‍යසනයකට ඇද දැමූ කෝවිඩ් සමයේ පැණි ධම්මිකලා ප්‍රොමෝට් කිරීම, දේශපාලන පක්ෂග්‍රාහීත්වය මත සීමිත කාලයෙන් වැඩිම පංගුවක් එම පුවත් විකාශනයට යොදා ගැනීම, විරුද්ධ පාර්ශ්වයට එරෙහි අවලාද මඩ ගැසීම සහ විකාශනය කරනු ලබන සියලු දේශපාලන වැඩසටහන් අදාළ පුද්ගල චරිත ප්‍රමෝට් කිරීමට හෝ දේශපාලන මතයක් වෙනුවෙන් යොදා ගැනීම ආදිය පෙන්වා දිය හැක. සිය ග්‍රාහකයාවද නොමග යවන මේ සටකපටකම් සියල්ල සිදු කරනු ලබන්නේ මහජන දේපලක් වූ විකාශන සංඛ්‍යාත යොදාගනිමිනි. එපමණක් නොව මූලික මාධ්‍ය ආචාර ධර්ම වන අපක්ෂපාතී බව, සාධාරණ බව, පාරදෘෂ්‍යභාවය වැනි අන්තර්ගත ගුණාංග කිසිවක් නොසලකාය. ඉදින් මෙවැනි සාපරාධී අපයෝජනයන් නියාමනය විය යුතු නොවේද?

මෙරට පාලනය කළ ආණ්ඩු ගණනාවක් අවස්ථා ගණනාවක දී මාධ්‍ය නියාමනය සඳහා නීති පැනවීමට ගත් කිසිඳු උත්සාහක් සාර්ථක නොවීම රටේ අවාසනාවක් විනා එකී අණපනත් ගෙන ආ පුද්ගලයන්ගේ පරාජයක් නොවේ. එම නිසා අද දවසේ විද්‍යුත් විකාශන නියාමනය සඳහා වූ යෝජනා සම්බන්ධයෙන් කුමන චෝදනා තිබුණ ද ඒ වෙනුවෙන් වූ සුදුසුම මගක් නිර්මාණය කරගැනීම, රටේ හෙට දවසේ සමාජ දේශපාලන මෙන්ම ආර්ථික වශයෙන් ද අත්‍යවශ්‍ය කරුණකි. එකී නියාමනයක් සඳහා විකාශන හිමිකරුවන්ගේ සංසදයේ එකඟතාවය ද පළකර ඇත. නමුත් මෙම සංසදයේ සාමාජිකත්වය නොදරණ එක් මාධ්‍ය ජාලයක් පමණක් අදාළ නියාමන කාර්යයට විරුද්ධව කටයුතු කරමින් සිටී. ඔවුන්ගේ පෙළඹවීම හමුවේ ඇතැම් දේශපාලකයන් ද මාධ්‍යවේදීන් ද විකාශන නියාමනය සම්බන්ධයෙන් පසුගාමී අදහස් සමාජගත කරනු දැකිය හැකිය. සමාජ සාධාරණත්වය අගයන, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සියලු මිනිසුන් එක්ව ආදානග්‍රාහී පාර්ශ්ව පරාජය කොට විද්‍යුත් විකාශන කාර්යය සමාජ ප්‍රගමනය වෙනුවෙන් යොදාගත හැකි පරිදි නියාමන කාර්යය සාර්ථක කරගත යුතුය.

නවන් පතිරත්න

# ඉතිහාසය වෙනස් කරන රනිල්




**අද අමෙරිකානු චීන එදිරිවාදිකම කලාපීය වශයෙන් තීරණාත්මක සාධකයක් බවට පත්වෙමින් පැවැතීම නොවිය යුතු බව පෙනවා දුන්නේය. මෑත කාලයේ එම එදිරිවාදිකම තීව්‍රවීම නිසා අමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව සහ ජපානය අතර (QUAD) වන කලාපයත්, අනෙක් පසින් ඉන්දු පැසිෆික් කලාපය සහ (BRI) එක තීරයක් එක මාවතක් ඇති විය. මෙය පැහැදිලිවම කලාපීය පැවැත්මට අභියෝගයකි. මේ මත ඔහු ආසියාව දෙකඩ කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කළේය.**

**"...මේ මොහොත වන විට අපි රට තුළ නීතිය හා සාමය, දේශපාලන ස්ථාවරත්වය සහ ආර්ථික ස්ථාවරත්වය ස්ථාපිත කර තිබෙනවා. මේ ස්ථාවරභාවය කෙටිකාලීන දෙයක් පමණක් බව අපට වැටහෙනවා. එබැවින් මෙම අභියෝගය ජය ගැනීමට අප තව බොහෝ දුර යා යුතුව තිබෙනවා..."** ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගියදා ජාතික නීතිඥ සමුළුව අමතමින් මෙලෙස පවසා තිබිණි.

මෙය වැදගත් ප්‍රකාශයක් වන්නේ මේ වන විට රනිල් රට ගොඩදැමීමට සමත් වී ඇති බවට බොහෝ පාර්ශ්වවලින් කියැවෙන අතරතුරදී ජනාධිපතිවරයා ඊට වෙනස් අදහසක් ප්‍රකාශ කිරීම නිසා නොවේ. සත්‍ය වශයෙන්ම පවතින තත්වය එය නිසාය. පැවැති ආර්ථික අර්බුදය හමුවේ එය විසඳා ගැනීම සම්බන්ධයෙන් ජනාධිපති රනිල් බොරු කියා නැත. රට රැවැට්ටුවේ නැත. කොහොම නමුත් ජනාධිපතිවරයා පැවැති බරපතල ආර්ථික සමාජීය පීඩාවන්ගෙන් රට මුදවා ගැනීමට සමත්වීම පැවති පීඩාකාරී තත්වය හා සලකා බැලීමේදී මහත් අස්වැසිල්ලකි. රට බාරගැනීමේ දී ඔහු පවසා සිටියේ මුලින්ම මිනිසුන්ගේ බඩගින්න නිවීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයකින් තොරව ලබාදීම සිදු කරන බවය. ඒ කිව්වා සේ එය සිදු කර තිබේ. නමුත් මේ කෙටිකාලීන පියවරකි. ආර්ථිකය තවදුරටත් පවතින්නේ ව්‍යවසනකාරිත්වයක නොවුවත් ආර්ථිකය ස්ථාවර බවට පත් කරගැනීමට ගත යුතු පියවරයන් රාශියක් තවදුරටත් ඉතිරිව තිබේ. මේ වන විට ආර්ථික ප්‍රතිසංස්කරණයන් ගණනාවක් ක්‍රියාත්මකව තිබුණද රනිල් යෝජනා කරන්නේ හුදු ආර්ථික ප්‍රතිසංස්කරණයන් නොවේ. ආර්ථික ප්‍රතිසංස්කරණයන්ගෙන් පලක් නැති බව මීට ටික කලකට පෙර ව්‍යාපාරික සමුළුවක් අමතමින් ඔහු ප්‍රකාශ කළේය. ඔහු යෝජනා කළේ ක්‍රම පද්ධතියේ බරපතල වෙනස්කමක් වෙත යායුතු බවය. එනම් මෙතුවක් කල් අනුගමනය කළ ප්‍රතිපත්ති සැලසුම් සියල්ල අනාගතයට ගැලපෙන ලෙස වන ක්‍රියාදාමයකට මුල පිරිය යුතු බවය. නමුත් එතැනට යන්න නම් කෙටිකාලීන පියවරයන් මගින් තුවාලයේ වේදනාවන් සමනය කරගත යුතුය. ඉන් පසුව දීර්ග කාලීන වැඩපිළිවෙලක් හරහා ස්ථාවරත්වය වෙනුවෙන් අවශ්‍ය පියවරයන් ගත යුතුය. ඒ සාර්ථක වීමත් සමඟ තිරසාර දියුණු ආර්ථිකයකට අවශ්‍ය පදනම වැටෙනු ඇත. තවදුරටත් රට සමඟ සෙල්ලම් කළ නොහැකි බව ඔහු හොඳින්ම දන්නා කාරණයකි. 2048 වන විට පූර්ණ සංවර්ධිත රාජ්‍යක් බවට රට පත්කරන බව කීම ජනාධිපතිවරයාගේ හුදු හිතළුවක් නොවේ. එසේ කියන්නේ, ඒ සඳහා අවශ්‍ය ශක්‍යතාවය රටේ පවතින බවත් ඒ සිහිනය සැබෑ කරගැනීමේ වුවමණාව රටට තිබෙන නිසාමත් නොවේ. වැදගත්ම දේ ඒ සඳහා විප්ලවීය වැඩපිළිවෙලක් තමන් සතුව තිබෙන නිසාය.

එහෙත් මේ වෙනුවෙන් කළ යුතු දැවන්ත මෙන්ම සංකීර්ණ කාර්යභාරයක් තිබේ. මෙහිදී ජනාධිපතිවරයා සමස්තයම එක් පද්ධතියක් ලෙස එක වර ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩි දියුණු කිරීමක් යෝජනා කරයි. අතනින් මෙතනින් තමන්ට දේශපාලනික වශයෙන් වාසිදායක තැන් සහ අවස්ථා තෝරමින් කෙටි කාලීනව ජනතාව සංතෘප්ත කරන ජනප්‍රිය තීන්දු ගැනීමේ සුපුරුදු ක්‍රමයට වඩා වෙනස්ය. එසේම එය තවදුරටත් මේ මුහුදෙන් වටවූ දූපතේ සීමාවට කොටු වුණ, ලෝකෙන් උතුම් රට ශ්‍රී ලංකාවයි කියමින් නටන පටු වැඩපිළිවෙලක්ද නොවේ. වර්තමානයේ සහ අනාගතයේ කලාපීය වර්ධනයන් සහ සෙසු ජාත්‍යන්තර ප්‍රවණතා සැලකිල්ලට ගෙන කෙරෙන දැවැන්ත ක්‍රියාදාමයකි. ඒ අනුව මේ ක්‍රියාත්මක වීම ශ්‍රී ලංකා ඉතිහාසයේ විප්ලවීය සමයක් ලෙස හැඳින්වීම වැරදි නොවේ. මෙවැනි පුළුල් වැඩපිළිවෙලක් ඉදිරිපත් වූ ප්‍රථම අවස්ථාව මෙය බව ද කිසිදු සැකයකින් තොරව පැවැසිය හැකිය. විශේෂයෙන්ම ලෝකයේ දේශපාලන සහ ආර්ථික මහා බල කඳවුරු අතර ඊට විකල්පව අලුත් බල කඳවුරක් නිර්මාණය කිරීම ද මෙම වැඩපිළිවෙලේම කොටසකි. එය කලාපීය වශයෙන් ඒ සියලුම රාජ්‍යයන්ගේ ගොඩනැංවීමට රුකුල් දෙන්නකි. රනිල් පසුගිය ජපන් සංචාරයේදී ද ඒ ගැන වන මතය සෘජුව ප්‍රකාශ කළේය. ඒ අනුව කලාපයේ ප්‍රබලම රාජ්‍යය වන ඉන්දියාව ඇතුළුව නැගී එන රාජ්‍යයන් සමඟ ඒකාබද්ධ වැඩසටහනක් වෙනුවෙන් ශ්‍රී ලංකාව තීරණාත්මක මැදිහත් වීමක් සිදු කරනු ඇත. ශ්‍රී ලංකාවේ භූ පිහිටීම අනුව ලබා දී ඇති වැදගත්කම මත, අමෙරිකාව සහ චීනය කේන්ද්‍ර කරගත් බල යුද්ධයේ දී ශ්‍රී ලංකාව දැනටත් තීරණාත්මක සාධකයකි. ඒ හරහා ලැබෙන වැදගත්කම අනුව කලාපීය බල කඳවුරක් නිර්මාණය කිරීමේදී ජනාධිපති රනිල් ගෙන තිබෙන ස්ථාවරය ලෝක සාමය රැකගැනීම සහ කලාපීය සංවර්ධනයට විශාල බලපෑමක් කරනු ඇත.

## විදේශ ප්‍රතිපත්තිය - රාජ්‍යතාන්ත්‍රික බව

ජපානයේ ටෝකියෝ නුවර පැවැති "ආසියාවේ අනාගතය පිළිබඳ 28 වන ජාත්‍යන්තර සමුළුව (Nikkei Forum) හමුවේ ජනාධිපතිවරයා අවධාරණය කළේ ගෝලීය භූ දේශපාලන හැසිරීම හමුවේ කලාපයේ භූමිකාව හැඩගැස්වීම සඳහා ආසියානු රාජ්‍යයන් හඬක් නැගීමේ වැදගත්කම ගැනය.

ආසියාවේ විවිධත්වය කලාපයේ ආර්ථික වර්ධනයට දායක වන සාධකයක් වන බවත් එය සැළකිය යුතු ගෝලීය බලවේගයක් බවත් ඔහු පෙන්වා දී තිබිණි. මේ වන විටත් පෘථිවියේ භූමි ප්‍රමාණයෙන් 30%කට ආසන්න ප්‍රමාණයක් සහ බිලියන 4.75 ක් එනම් ගෝලීය ජනගහණයෙන් 60%ක් සිටින ආසියාව ලොව විශාලතම ආර්ථිකය බවට පත්ව ඇති නමුත් ලෝක දේශපාලනයේ සහ ආර්ථිකයේ එයට හිමි තීරණාත්මක බව තවම නොසලකා හැර තිබේ. එසේම, ආසියා-පැසිෆික් කලාපය සහ ඉන්දියන් සාගරය අතර වෙනස පිළිබඳව පැහැදිලි කළ ජනාධිපතිවරයා ආසියා-පැසිෆික් කලාපය ව්‍යුහගත කලාපීය සංවිධානයක් වන අතර ඉන්දියන් සාගර කලාපය නැගී එන අවකාශයක් බව ද සඳහන් කළේ ගෝලීය බලවේගයක් ලෙස මෙම කලාපය ගොඩනැංවීමේ අනාගත අපේක්ෂා සහිතවය. එසේම එම කාර්යභාරය වෙනුවෙන් ඇති අයිතිවාසිකම ගැනද ඔහු පෙන්වා දුන්නේ 1955 බැන්ඩුං නුවර පැවති ආසියානු අප්‍රිකානු සමුළුවේ දී සහ ඉන්දියන් සාගරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ ඉන්දියන් සාගර කලාපය සාම කලාපයක් ලෙස නම් කර තිබීමෙන් බලගතු රාජ්‍යයන්ට මෙම කලාපයේ වැඩවලට ඇඟිලි නොගසා කටයුතු කිරීම විය යුතු බව මතක් කරමිනි. එසේම ගෝලීය මහා බලවතුන්ගේ එදිරිවාදිකම්වලදී ඒ ඒ කඳවුරුවලට පක්ෂග්‍රාහීව කටයුතු කිරීමෙන් ආසියානු ජාතීන් වැළකී සිටින බව ද කීවේ එම බල අරගලවලට මැදිහත් වී කලාපීය ගොඩනැංවීම් විනාශ කරනොගත යුතු බැවිනි.

අද ඇමරිකානු - චීන එදිරිවාදිකම කලාපීය වශයෙන් තීරණාත්මක සාධකයක් බවට පත්වෙමින් පැවැතීම නොවිය යුතු බව පෙන්වා දුන්නේය. මෑත කාලයේ එම එදිරිවාදිකම තීව්‍රවීම නිසා ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව සහ ජපානය අතර (QUAD) වන කලාපයත්, අනෙක් පසින් ඉන්දු-පැසිෆික් කලාපය සහ (BRI) එක තීරයක් - එක මාවතක් ඇති විය. මෙය පැහැදිලිවම කලාපීය පැවැත්මට අභියෝගයකි. මේ මත ඔහු ආසියාව දෙකඩ කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කළේය. ඇමරිකානු - චීන එදිරිවාදිකම් සම්බන්ධයෙන්, ජනාධිපතිවරයා තවදුරටත් අවධාරණය කළේ මේ බලවත් රාජ්‍යයන් දෙකෙන් එකක් තෝරා ගැනීමට ආසියාතික රටවලට බල කිරීම විය නොවිය යුතු බවත් සියලු බල කඳවුරු සමඟ වන අන්‍යෝන්‍ය සහයෝගිතාව මත මැදිහත් පිළිවෙතකට කලාපයට පැමිණිය හැකි බවය. ඒ අතර චීනය සමඟ ස්ථාවර සහ ඵලදායී සබඳතාවක් ගොඩනගා ගැනීමට ගෙන ඇති G7 (අමෙරිකාව, ජපානය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ජර්මනිය, ඉතාලිය, කැනඩාව සහ යුරෝපා සංගමය) ස්ථාවරය ශ්‍රී ලංකාව පිළිගන්නා බව පැවසූ ජනාධිපතිවරයා, එයට ශ්‍රී ලංකාවේ පූර්ණ සහයෝගය ලබාදීමට සූදානම් බවත්, එය සාමකාමී වාතාවරණයක් උදාකර ගැනීමට ඉවහල් වන බව ද ප්‍රකාශ කළේය. එමෙන්ම "නිදහස් සහ විවෘත ඉන්දු පැසිෆික්" කලාපයක් සඳහා ජපානයේ දැක්මට සහාය පළ කළ ජනාධිපතිවරයා කලාපයේ සාමය සහ සහයෝගීතාව පෝෂණය කිරීම සඳහා ආසියානු ජාතීන් අතර විවෘත සංවාදයක් ද ඉල්ලා සිටියේය.

මෙම සමුළුවේදී ජනාධිපතිවරයා තවත් වැදගත් කාරණයක් පෙන්වා දුන්නේය. ඒ කලාපීය රටවල දේශපාලන ක්‍රමවල වෙනස්කම් සහ මානව හිමිකම් පිළිබඳ එකිනෙකා තුළ තිබෙන අවබෝධයේ විවිධත්වය පිළිබඳවය. විශේෂයෙන්ම මේ තත්වයන් දඩමීමා කරගෙන බටහිර රටවලින් එල්ල වන බලපෑම්වලට නතුවීමට සිදුවීමේ ගැටළුව ගැනය. මූලික දේශපාලන වටිනාකම් පිළිබඳ සම්මුතියකට එළැඹීමේදී ජාතීන්ට අයත් විවිධ පසුබිම් සලකා බැලීම විය යුතු බවත් නීති මත පදනම් වූ වැඩපිළිවෙළක් සඳහා නීතිරීති පිළිපැදීමේ අවශ්‍යතාව ද අවධාරණය කළ අතර මෙම නීතිරීති අඛණ්ඩව අනුගමනය කරන ලෙස බටහිර රටවලින් ඉල්ලා සිටියේය. කොහොම නමුත් මෙම ගැටළු බාධා හමුවේ සියළුම ආසියානු රටවල් අතර සහයෝගීතාවයේ අවශ්‍යතාවය අවධාරණය කළ ජනාධිපතිවරයා අනාගතයේදී ප්‍රධාන ආසියාතික රටවල් එකඟතාවකට පැමිණීමේ හැකියාව මත කලාපීය සාර්ථකත්වය රඳා පවතින බව පැවසීය.

ඉන්දු-පැසිෆික් කලාපයේ බහු ස්ථර සම්බන්ධතාවයක් සඳහා ශ්‍රී ලංකාව කැපවී සිටින බවත්, අග්‍රාමාත්‍ය ෆුමියෝ කිෂිඩාගේ "**සාමය සඳහා වූ මූලධර්ම සහ සෞභාග්‍යය සඳහා වූ නීති**" ප්‍රතිපත්තියට ජනාධිපතිවරයා පූර්ණ සහය පළ කරන බවත් ජනාධිපති වික්‍රමසිංහ පැවසීය. සෞභාග්‍යය සඳහා වන රීතිවලට අනුකූලව, ශ්‍රී ලංකාව ආර්ථික ලිහිල්කරණයේ ඉහළ මට්ටමක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම (RCEP) හි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන බවත් ඔහු පැවසීය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ ප්‍රධාන බලකඳවුරු දෙක ඉලක්ක කළ විවේචනය මෙන්ම කලාපීය බල කඳවුරක් ගොඩනැංවීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් කළ මෙම ප්‍රකාශය ජාත්‍යන්තර වශයෙන් වැදගත් ප්‍රකාශයකි. එහෙත් මෙහි ඇති වැදගත්ම දේ මේ කරුණු කාරණා ශ්‍රී ලංකාවේ අභිවෘද්ධියට බලපාන්නේ කෙසේ දැයි සලකා බැලීමය. වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දෙමින් තිබෙන අර්බුද ජය ගැනීමත් බරපතල ගැටළුවකට මුහුණ දී තිබියදී කොහෙවත් ඇති ජාත්‍යන්තර ප්‍රශ්නයක් වෙනුවෙන් ජනාධිපති රනිල් හොට දාන්නේ තවත් මොන මරාලයක් රටට පාත් කරගන්නද කියා ඇතැමුන් ප්‍රශ්න කරමින් තිබෙනුද දකින්නට තිබිණි. එසේම ජනාධිපතිවරයා ඇමරිකන් ගැත්තකුය, ඒ නිසා චීනය මෙම කලාපය තුළ කරන මැදිහත්වීමට එරෙහිව මෙම ප්‍රකාශය කළ බවටත් ඇතැම් විග්‍රහයන් පළවී තිබිණි. නමුත් ජනාධිපතිවරයා සත්‍ය ලෙසම මැදිහත් වූයේ ශ්‍රී ලංකාව මුහුණ දී ඇති බාහිර අර්බුදයන්ගෙන් ගලවා 2048 වන පූර්ණ සංවර්ධිත රාජ්‍යයක් ගොඩ නංවාලීම වෙනුවෙන් වන ජාත්‍යන්තර වටපිටාව රටට වඩාත් හිතකර ලෙස ගොඩනංවා ගැනීම වෙනුවෙනි. මෙය සංවර්ධනය වෙමින් පවතින කලාපයේ සෙසු රාජ්‍යයන්ටද තිබෙන ගැටළුවක් විසඳාදීමට මැදිහත් වීමකි. ඒ සඳහා ඔහුට කශේරුකාවක් තිබීම ගැන ශ්‍රී ලාංකිකයන් වශයෙන් එය අගේ කළ යුතුව ඇත. කොහොම නමුත් ජනාධිපතිවරයාගේ මේ ප්‍රතිපත්තිමය එළඹුම රටේ අභිවෘද්ධියට හේතු වන්නේ කෙසේදැයි විමසිය යුතුය.

## අපේ අරගලය 2048

පසුගියදා "**ජාතික පරිවර්තන මාර්ග සිතියම**" ඉදිරිපත් කරමින් ජනාධිපතිවරයා ජාතිය අමතමින් විශේෂ ප්‍රකාශයක් සිදු කළේය. "ශ්‍රී ලංකාව දැන් වර්ධනාත්මක,

09 පිටුවට

08 පිටුවෙන්

**සමෘද්ධිමත් ගමනක් යාමට සූදානම්. අප ඒ ගමන ඉදිරියට යා යුත්තේ කෙසේද? ඒ සඳහා අප අනුගමනය කළ යුතු පිළිවෙත් මොනවාද?"** යන්න ගැන ඔහු පැහැදිලි වැඩපිළිවෙලක් ඉදිරිපත් කර සිටියේය. පැවැති අර්බුදකාරිත්වයෙන් රට මුදවාගත් පසුව ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගත් දීර්ගකාලීන වැඩපිළිවෙලෙහි පදනම සැකසීම මෙමගින් ඉදිරිපත් කර තිබිණි.

මේ අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, ආයෝජන ප්‍රවර්ධන, සමාජ ආරක්ෂණ ජාලය, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ යන ප්‍රධාන කුලුනු 04ක් ඔස්සේ රටේ ඉදිරි ගමන සැලසුම් කර තිබේ. ඒ සම්බන්ධයෙන් පසුගිය සතියේ පැහැදිලි කිරීමක් කරනු ලැබුවේය.

මෙම පියවරයන් මගින් ඉදිරි වසර 05 තුළ රටේ ආර්ථිකය පූර්ණ ලෙස ස්ථාවර කරන අතර, ඊළඟ වසර 25 තුළ ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලබන දියුණු රටක් බවට පත්කරන බව පැවසූ ජනාධිපතිවරයා එම මුල් වසර 05න් පසු රට නඟාසිටුවීමේ වැඩපිළිවෙළ ඊළඟ පරම්පරාවට පැවරෙන බවත් ඒ සඳහා තරුණ තරුණියන් සූදානම් කරවන බවත් කියා සිටියේය. රටේ සංවර්ධනයට අවශ්‍ය පදනම ශක්තිමත්ව නිවැරදිව සකස් කළ පසු ඒ මත හිඳ ඉදිරි පරම්පරාවට අවශ්‍ය ගොඩනැංවීම් අනාගතයට ගැලපෙන ආකාරයෙන් සිදු කළ හැකිය. නිදහසෙන් පසුව මෙවැනි පුළුල් වැඩ පිළිවෙලක් වෙත යෑම මඟහැරී තිබුණකි. විවිධ පාලනයන් තමතමන්ගේ දේශපාලනික අවශ්‍යතා වෙනුවෙන් කළ කී දේ මිස අනාගතය ඉලක්ක කළ දියුණු සංවර්ධනාත්මක ප්‍රතිපත්ති සැලසුම් වැඩපිළිවෙළ නොතිබීම රට බංකොළොත්වීම දක්වා ගෙන ආ බව නැවත පැහැදිලි කළ යුතු නැත.

මෙම "**ජාතික පරිවර්තන මාර්ග සිතියම**" ඔස්සේ ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණමය වැඩපිළිවෙළ පහසු කටයුත්තක් නොවූවත් සෑම විටම රටට යහපත් දේ සිදු කිරීමට රජය කැපවී සිටින බව අවධාරණය කළ ජනාධිපති රනිල් අප ගන්නා තීරණ කෙතරම් දුෂ්කර සහ වේදනාකාරී වුව ද අනාගත පරපුර වෙනුවෙන් රට යළි ඉහළට ඔසවා තැබීමට හැකි වන්නේ එම දුෂ්කර මාවතේ නිවැරදි ප්‍රතිපත්ති අනුව ඉදිරියට යාමෙන් පමණක් බවද කියා සිටියේය.

මෙම වැඩපිළිවෙල "**2048 වන විට ලෝකයේ පූර්ණ සංවර්ධිත රාජ්‍යයක් බවට පත් වීමේ අපේ ඉලක්කය ඉටු කර ගැනීමටයි. නවීන ලෝකයට හා නවීන තාක්ෂණයට ගැළපෙන පරිදි අපේ ආර්ථිකය හැඩගස්වා ගත්තේ නැත්නම් අපට යන්නට සිදු වෙන්නේ ආපස්සටයි. එවැනි අවගමනක ප්‍රතිඵලය වෙන්නේ රට ආර්ථික යටත් විජිතයක් බවට පත්වීමයි.**" කලින් පෙන්වා දුන් පරිදි ජාත්‍යන්තරය බල දේශපාලනය තුළ ලංකාව දැනටත් පවතින්නේ අමෙරිකානු සහ චීන බල කඳවුරු අතර දෝලනය වෙමින් ඔවුන්ගේ ආර්ථික යටත් විජිතයක් බවට පත්ව එහි කොන්දේසිවලට යටත්වය. රටේ ආර්ථිකය තීන්දු වූයේ ඒ අනුවය. කලාපීය බල කඳවුරක් නිර්මාණය කිරීමේ වැදගත්කම ජනාධිපතිවරයා තේරුම් ගෙන තිබෙන්නේ මෙම ජාත්‍යන්තර බල දේශපාලනයෙන් ගැලවී මිස කිසිවකුට පක්ෂග්‍රාහීවීමෙන් මෙය සිදු කළ නොහැකි නිසාය. ඒ අනුව "**ජාතික පරිවර්තන මාර්ග සිතියම**" සහ මෙම වසර අවසන ඉදිරිපත් කරන "**ජාතික ප්‍රතිසංවිධාන සැලසුම**" ද රට සමස්ථ පද්ධතියක් ලෙස සලකා සිදුකෙරෙන විප්ලවීය මෙහෙයුමක් වෙනු ඇත. මේ වැඩපිළිවෙල සහ එහි ක්‍රියාත්මක වීම දීර්ග වශයෙන් සාකච්ඡාවට සංවාදයට විසංවාදයට ලක්කරමින් සහ ඊට සහභාගී වීමෙන් 2048 සංවර්ධික ශ්‍රී ලංකාවක් බිහි කරගැනීමට දායකවීමට මෙරට සියළු පුරවැසියන්ට හැකියාව තිබේ. එමෙන්ම එය යුතුකමක් වගකීමක් කර ගත යුතුය. එසේ නොමැතිව එම ඉලක්ක ජයගැනීමට නොහැකිය. ඒ අතර ජනාධිපතිවරයා රටේ සියළු වෘත්තීය ක්ෂේත්‍රවල, ව්‍යාපාරික ක්ෂේත්‍රවල ප්‍රධානින්, අමතමින් මේ සංවර්ධන සිහිනය සැබෑකර ගැනීම වෙනුවෙන් ඒ ඒ ක්ෂේත්‍රවල දායකත්වය සම්බන්ධයෙන්ද මේ වන විට සංවාදයක් පවත්වාගෙන යයි. පසුගියදා ජාතික නීතිඥ සමුළුව හමුවේ මෙරට අධිකරණ විනිසුරුවරුන් නීතිඥයන් අමතා පැහැදිලි කළේ මෙරට දිගුකාලීන සංවර්ධනය සහතික කරන, ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක සිට සංවර්ධිත රටක් කරා ගෙන යන නීති අපගේ නීති පද්ධතියට හඳුන්වා දීමට නීති ක්ෂේත්‍රයේ විය යුතු ප්‍රතිසංස්කරණයන් ගැනය. මේ අනුව ජනාධිපතිවරයා සිල්ලර වැඩවලින් ඔබ්බට ගොස් සමස්ත ක්‍රියාවලියක් වෙනස් කිරීමේ දැවැන්ත වැඩපිළිවෙලකට අත ගසා ඇති බව පැහැදිලිය. මෙය රටේ ඉතිහාසය වෙනස් කරන විප්ලවීය ක්‍රියාදාමයක් වන්නේ ඒ නිසාය.

ජයතුංග බණ්ඩාර



# සාම කලාපයකට පාර කියන ෂැන්ග්‍රි-ලා සංවාදය

ෂැංග්‍රි-ලා සංවාදය හෙවත් The Shangri-La Dialogue (SLD) යනු සිංගප්පූරුවේදී පවත්වනු ලබන අන්තර් රාජ්‍ය ආරක්ෂක සමුළුවයි. ජාත්‍යන්තර උපායමාර්ගික අධ්‍යයන ආයතනය (IISS) විසින් වාර්ෂිකව සිංගප්පූරුවේදී පවත්වනු ලබන මෙම ෂැංග්‍රි-ලා සංවාදය සඳහා සාමාන්‍යයෙන් සහභාගී වනු ලබන්නේ ආසියා-පැසිෆික් ප්‍රාන්තවල ආරක්ෂක අමාත්‍යවරුන්, ස්ථිර අමාත්‍යාංශ ප්‍රධානීන් සහ හමුදා ප්‍රධානීන්ය. වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක මෙම ෂැංග්‍රි-ලා සංවාදය, ජාත්‍යන්තර ආරක්ෂක ප්‍රතිපත්ති තීරණ ගන්නන්ගේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා වඩාත් වැදගත් ස්වාධීන සංසදයක් බවට පත්ව ඇත.

මෙම ෂැංග්‍රි-ලා සමුළුව ආරම්භවීමට පෙර ආසියාවට ආරක්ෂක රාමුවක් නොතිබිණි. කෙසේ වෙතත් 2002 වසරේදී ආරම්භ වූ මෙහි ආරම්භක සංවාදය නිල නොවන ආරක්ෂක සමුළුවක් විය. 2002 වසරේ සිට ක්‍රම ක්‍රමයෙන් පුළුල් වූ මෙය, මේ වන විට කලාපීය වශයෙන් අතිශය සුවිශේෂී තත්වයක් දක්වා වර්ධනය වී ඇත. මෙම ෂැංග්‍රි-ලා සමුළුව වඩාත් සුවිශේෂී වන්නේ කලාපීය අමාත්‍යවරුන්, ඉහළ ආරක්ෂක නිලධාරීන් ඇතුලු පිරිසට ද්විපාර්ශ්විකව හා බහු පාර්ශ්විකව හමුවීමේ අවස්ථාව උදා කරදීම හේතුවෙනි. මෙහිදී රාජ්‍ය තාන්ත්‍රික කටයුතු මෙන්ම කලාපීය ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් සාකච්ඡා හා තීන්දු තීරණ ගැනීම සඳහා වාර්ෂිකව සේවා සපයන අවස්ථාවක් ලෙස මෙම ෂැංග්‍රි-ලා සමුළුව ප්‍රකට වී ඇත.

මෙවර ද මෙම සමුළුව ජුනි 02වන දා සිට 04වන දා දක්වා සිංගප්පූරුවේ දී පැවැති අතර, මේ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා සහභාගී විය. ජූනි 02වන දා ආරම්භ වූ මෙම සමුළුවේ ප්‍රධාන දේශනය ඔස්ට්‍රේලියානු අගමැති ඇන්තනි ඇල්බනීස් මහතා විසින් සිදු කරනු ලැබූ අතර ඉන්දියාව, ඕමානය, ප්‍රංශය, පාකිස්ථානය සහ එක්සත් ජනපදය ඇතුළු රටවල් රැසක ප්‍රමුඛ පෙළේ නියෝජිතයෝ ඊට එක්ව සිටියහ.

ස්ථාවර සහ සමතුලිත ආසියා පැසිෆික් කලාපයක් ඇති කිරීම, කලාපීය ගැටළු විසඳීම, ආසියාවේ සමුද්‍රීය ආරක්ෂාවේ විකාශනය, ඉන්දු-පැසිෆික් කලාපයේ එක්සත් ජනපද නායකත්වය ඇතුළු විවිධ තීරණාත්මක භූ දේශපාලනික ගැටළු පිළිබඳව මෙම සමුළුවේ දී අවධානය යොමු කෙරිණි.

ඉන්දියානු සාගර සාම කලාප සංකල්පය ඉතා දිගු අතීතයක් සහිත යෝජනාවකි. 1971 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී මෙම ඉන්දියානු සාගර සාම කලාප යෝජනාව (IOPZ) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අතිමහත් කැපවීමක් දක්වා ඇත. අතීතයේ සිටම ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ යාත්‍රා නිදහස හා සන්නිවේදන මුහුදු මාර්ගවල සුරක්ෂිතතාවය හා ආරක්ෂාව තහවුරු කිරීමේ ක්‍රියාවලීන්හිදී පෙරමුණ ගෙන කටයුතු කර ඇති අතර, සෑම අවස්ථාවකදීම මෙම ක්‍රියාවලිය කලාපීය සුරක්ෂිතතාවය හා ස්ථායීතාවය පවත්වාගැනීම සඳහා වන අවශ්‍යතාවය වෙනුවෙන් පෙනී සිට ඇත.

විවිධත්වයෙන් යුත් රාජ්‍ය ගණනාවක් ඉන්දීය සාගර කලාපයට අයත් වන අතර, ගෝලීය වෙළඳාමේදී වැඩි ආර්ථික ශක්‍යතාවයක් හිමිව ඇත. මේ හේතුව නිසාම ආසියාවේ නැගී එන රාජ්‍යයක් ලෙස චීනයේ වැඩි අවධානයක් ඉන්දියානු සාගර කලාපයට හිමි වී ඇත. මේ හේතුව නිසාම ඉන්දියානු සාගර කලාපයේ කුඩා රාජ්‍යයන් මෙන්ම ඉන්දියාව ද යම් අභියෝගාත්මක තත්වයට මුහුණ දී ඇති අතර, ඇතැම් අවස්ථාවලදී එය යම් තර්ජනාත්මක ස්වරූපයක් ගත් බව ද පෙනී යයි.

මේ හේතුව නිසාම ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂාව අතිශය වැදගත් මාතෘකාවක් බවට පත්ව ඇත. මේ සම්බන්ධයෙන් වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පසුගියදා ප්‍රකාශ කර සිටියේ ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂාව තහවුරු කරමින් ලෝකයට විවෘත කර, බලගතු ආසියාවක් නිර්මාණය කිරීමට සැලසුම් සකස් කළ යුතු බවයි. එසේම ඉන්දියානු සාගර කලාපයේ නාවික නිදහස තහවුරු කරමින් ශ්‍රී ලංකාව නාවික වාණිජ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කළ යුතු බව ද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මෙහිදී අවධාරණය කළේය.

මෙම අදහසේම දිගුවක් ලෙස ෂැංග්‍රි-ලා සංවාදයේදී ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති උපදේශක සාගල රත්නායක මහතා අවධාරණය කර සිටියේ ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂක සහයෝගීතාව වර්ධනය කර ගැනීම සඳහා සියලුම පාර්ශ්වකරුවන් සාධනීය සංවාදයකට එළැඹිය යුතු බවයි.

ස්ථාවර සහ සමතුලිත ආසියා පැසිෆික් කලාපයක් ඇති කිරීම, කලාපීය ගැටළු විසඳීම, ආසියාවේ සමුද්‍රීය ආරක්ෂාවේ විකාශනය, ඉන්දු-පැසිෆික් කලාපයේ එක්සත් ජනපද නායකත්වය ඇතුළු විවිධ තීරණාත්මක භූ-දේශපාලනික ගැටළු පිළිබඳව සියලු පාර්ශ්වවල අවධානය යොමු විය යුතු බව මෙහිදී සාගල රත්නායක මහතා අවධාරණය කර සිටියේය.

සිය දේශනයේදී සාගල රත්නායක මහතා ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ අවධානය යොමු කළ අතර, ඉන්දියානු සාගර කලාපය සාම කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නය ද පැහැදිලි කළේය.

මහා බලවතුන්ගේ එදිරිවාදිකම් සහ බාහිර ගැටුම් ඉන්දියන් සාගරයෙන් බැහැරව තබා ගැනීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කළ අතර, නාවික ගමනාගමනය සහ ගුවන් ගමන්වල නිදහස ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය හා කැපවීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක කරුණු දැක්වීමක් සිදු කෙරිනි.

මෙවර පැවැත්වුණු ෂැංග්‍රි-ලා සංවාදයට සාගල රත්නායක මහතා සහභාගීවීමේ සුවිශේෂිත්වය වන්නේ මෙම සමුළුවට සමගාමීව ජාත්‍යන්තර වශයෙන් අතිශය වැදගත් සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීම අවස්ථාව හිමිවීමයි. මෙහි මුලික අවස්ථාව ලෙස මෙම සමුළුව අතරවාරයේදී සාගල රත්නායක මහතා සිංගප්පූරු විදේශ අමාත්‍ය විවියන් බාලක්‍රිෂ්ණන් මහතා ඇතුළු ෂැංග්‍රි-ලා සංවාදය සඳහා එක්ව සිටි ඉහළ පෙළේ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් කිහිපදෙනෙකු සමඟ සාකච්ඡා පැවැත්වීය.

සිංගප්පූරු විදේශ අමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාවේ දී දෙරට අතර ද්විපාර්ශ්වික සහයෝගීතාව ඉහළ නංවා ගැනීමට ශ්‍රී ලංකාවේ කැපවීම සහතික කළ අතර, පසුගිය අභියෝගාත්මක කාලවකවානුවේ දී සිංගප්පුරුව ශ්‍රී ලංකාවට ලබාදුන් සහය පිළිබඳව කෘතඥතාව පළ කෙරිණි. එසේම ආහාර සුරක්ෂිතතාව, පුනර්ජනනීය බලශක්තිය සහ වරාය සහ සැපයුම් ක්ෂේත්‍රවලට අදාළ දෙරට අතර සහයෝගීතාව තවදුරටත් ඉහළ නංවා ගැනීම පිළිබඳ එහිදී පුළුල් අවධානයක් යොමු කෙරිණි.

මීට අමතරව ඔස්ට්‍රේලියාවේ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේකම් ග්‍රෙග් මොරියාටි මහතා සහ සාගල රත්නායක මහතා අතර පැවති සාකච්ඡාවේදී සමුද්‍රීය ආරක්ෂාව, මිනිස් ජාවාරම් මැඩලීම මෙන්ම ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රේලියාව අතර ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු විය.

පාකිස්ථාන සන්නද්ධ හමුදාවන්හි ඒකාබද්ධ මාණ්ඩලික කමිටුවේ ප්‍රධානී ජෙනරාල් සහීර් ෂම්ෂාඩ් මිර්සා මහතා සමඟ පැවැති සාකච්ඡාවේදී ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර ආරක්ෂක සහයෝගීතාව වර්ධනය කර ගැනීම මෙන්ම කලාපීය ස්ථාවරත්වය ප්‍රවර්ධනය කර ගැනීම කෙරෙහි එහිදී පුළුල් ලෙස සාකච්ඡා කෙරිණි.

එසේම එක්සත් ජනපදයේ ඉන්දු පැසිෆික් විධානයේ ආඥාපති අද්මිරාල් ජෝන් ඇක්විලිනෝ මහතා අතර පැවති හමුවේ දී ඉන්දීය සාගර කලාපයේ පවතින ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කෙරුණු අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය සාගල රත්නායක මහතා විසින් පැහැදිළි කරනු ලැබීය.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ (ICRC) ආසියා සහ පැසිෆික් කලාපයේ අධ්‍යක්ෂිකා ක්‍රිස්ටීන් සිපොල්ලා මහත්මිය සමඟ පැවති හමුවේ දී කලාපයට අදාළ මානුෂීය ගැටළු පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර එවැනි අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම අවධාරණය කෙරිණි.

මේ සමගම ඉන්දියාවේ නියෝජ්‍ය ජාතික ආරක්ෂක උපදේශක වික්‍රම් මිසිරි මහතා අතර පැවැති හමුවේදී දෙරටේ ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද පිළිබඳව පුළුල් අවධානයක් යොමු කෙරුණු අතර, යුක්‍රේන ආරක්ෂක අමාත්‍ය ඔලෙක්සි රෙස්නිකෝ මහතා සමඟ ද සාකච්ඡාවක් පැවැත්විණි.

සිංගප්පූරුවේ ආරක්ෂක අමාත්‍ය ආචාර්ය එන්ග් එන්ග් හෙන් (Dr. Ng Eng Hen) විසින් පවත්වන ලද වට මේස සාකච්ඡා දෙකක් පැවැති අතර, මෙහිදී කලාපයේ ප්‍රධාන ආරක්ෂක ගැටළු පිළිබඳ පුළුල් ලෙස සාකච්ඡා කෙරිණි.

එසේ පැවැති ද්විපාශ්වික සුහද සාකච්ඡා, එකඟතා ගණනාවක් ද සහිතව 20 වැනි වරට පැවැති මෙම ෂැංග්‍රි-ලා සංවාදය ගෝලීය වශයෙන් මෙන්ම කලාපීයවත් අපේ රටට අතිශය වැදගත්ය. මන්ද දිගු කාලීන දැක්මකින් යුතු වැඩපිළිවෙලක් සහිතව ජනාධිපති රනිල් වික්‍රමසිංහ දියත් කරමින් සිටින රට ගොඩ නැගීමේ ඉදිරි ගමනට රට වැසියාගේ වගේම ජාත්‍යන්තර සහයෝගය ද අත්‍යවශ්‍ය වන බැවිනි. ඒ අනුව ගත් කල ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක සාගල රත්නායක මහතාගේ මෙම සහභාගීත්වය ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තරයේ හොඳහිත දිනාගැනීමට මෙන්ම අනාගතයේ රට තුළට ආයෝජන කැඳවා ගැනීමට, වෙළඳපොළ අවස්ථා වර්ධනය කරගැනීමට ද අවශ්‍ය පසුබිමක් ගොඩනගා ගැනීමට මෙහිදී අවස්ථාව නිර්මාණය වූ බැවිනි.

අවන්ත ඉඩමේගම




රටක නැගීමේ හා බැසීමේ තරම තීරණය කරන මූලික දත්ත සමුදායක් ඇත. ඒ අනුව රටේ සංවර්ධනයේ වර්ධනය හෝ අවවර්ධනය තීරණය කිරීම ආර්ථික විද්‍යාත්මක කරුණකි. ලොව ඕනෑම රටක මෙම ඉලක්කම් මත පදනම් වූ මැන බැලීම් අනිවාර්යක්. ශ්‍රී ලංකාවේ මෙම ආර්ථික දත්ත මත වන මැන බැලීම් සිදුවන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි ආයතන විසිනි.

කෙසේ නමුත් මෙම ආර්ථික හා සමාජීය දත්ත විශ්ලේෂණයන් මත වන පුරෝකථනයන් රටේ දේශපාලන ප්‍රවාහය සමග සෘජුව සම්බන්ධතාවයක් පවතී. රජය ගන්නා තීන්දු තීරණ විසින් රටේ ආර්ථිකය හා සංවර්ධනය සඳහා බලපෑම අනිවාර්යය. ජනාධිපතිවරයා, කැබිනට් මණ්ඩලය හෝ පාර්ලිමේන්තුවේ සම්මුතියෙන් ගන්නා තීන්දු මත රටේ ආර්ථිකය හා සාමාජීය සංවර්ධන අංශයට අතිශය බලපෑම් සහගත වෙයි. කෙසේ නමුත් මේ ආර්ථික දත්ත සහ සංඛ්‍යා ලේඛන මත පදනම්ව කරන පුරෝකථන රටක සංවර්ධනයේ තරම සහ එහි අනාගතය ගැන පොදු අදහසක් ගත හැකිය.

ඒ අනුව රටේ සංවර්ධනය මැන ගන්නා මූලික දත්ත කිහිපයක් වේ. ඒ අතර උද්ධමනය, පොලී අනුපාතය, රැකියා නියුක්ති අනුපාතය, විනිමය අනුපාතය, විදේශ සංචිත ප්‍රමාණය, ආර්ථික වර්ධනය වේගය, ඒක පුද්ගල ආදායම වැනි දෑ ප්‍රධානය.

## උද්ධමනය

රටේ උද්ධමනය, කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් තීරණය කරයි. ශ්‍රී ලංකාවේ පාරිභෝගික භාණ්ඩ හා සේවා නියෝජනය වන භාණ්ඩ පැසෙහි පොදු මිල මට්ටම් අනුව එම ගණනය කෙරේ.

ඒ අනුව කොළඹ මිල දර්ශකයෙහි (2021 = 100) වාර්ෂික ලක්ෂමය වෙනස මගින් මනිනු ලබන මතු පිට උද්ධමනය 2023 අප්‍රේල් මාසයේ වාර්තා වූ සියයට 35.3හි සිට 2023 මැයි මාසයේදී 25.2 දක්වා පහළ ගොස් ඇත. පසුගිය 2022 වසරේ ඔක්තෝබර් මාසයේ වන විට උද්ධමනය 66.0ක පැවැති අතර මෙය 2022 නොවැම්බර් මාසයේ දී සියයට 61.0ක් දක්වා පහළ ගියේය. ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 85.6ක් වූ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 56.3ක් විය.

මෙම උද්ධමනය පහළ යාම ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවන්ට අනුව ආර්ථික ප්‍රතිසංස්කරණයන් සමග කළ පුරෝකථනයන්ට සාපේක්ෂව සමාන වන අතර මෙය 2022 උද්ධමනය සමග සැසඳූ විට අතිශය ප්‍රසංසනීය තත්වයක පවතී. පෙර වර්ෂවල උද්ධමනයට බලපෑ හේතු සාධකයන් කෙරෙහි අවධානය යොමු කළ හොත් පෙනී යන්නේ බදු සහනලබා දීම, පොලි අනුපාතයන් පහල අගයක් තිබීම, රාජ්‍ය ආදායම් අහිමිවීම තුළ මුදල් මුද්‍රණය කරමින් අනවශ්‍ය මුදල් පොම්ප කිරීමක් වෙළඳපොළ වෙත සිදුකිරීමත් ඩොලරයේ අගය කෘතිමව පහළ මට්ටමක තබා ගැනීම වෙනුවෙන් විදේශ සංචිත මුදා හැරීමත් ආදිය හේතුවෙන් සංචිත හිඟයක් ඇතිවීම ආදිය මේ තත්වයට බලපෑ ඇති බවයි. මහ බැංකු අධිපතිවරයා පවසන පරිදි 2020 සහ 2021 වසරවලදී රුපියල් බිලියන 400කට ආසන්න ප්‍රමාණයක මුදල් අච්චු ගසා බැංකු පද්ධතියට මුදා හැර තිබිණි. 2019 වන විට ඩොලර බිලියන 7කට වඩා තිබූ සංචිත වසර දෙකක් තුළ නැත්තටම නැතිකර ගෙන තිබිණි. මේ අනුව ලෝකයේ ඉහළම උද්ධමන අනුපාතයක් පවතින රටවල් අතරට මෙරට පත්විය. මෙය ඒ වන විට රට කරවූ පිරිස් විසින් ලංකාවේ ආර්ථිකයට සිදු කළ මහා පරිමාණ හානියයි.


නිවැරදි ආර්ථික කළමණාකරණයක් නොමැතිවීම මත 2022 උද්ධමනය දැඩි ලෙස ඉහළ ගිය නමුත් 2022 අවසාන කාර්තුවෙන් පසුව මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම හරහා මුදල් අච්චු ගැසීම සීමා කිරීමට යොමු විය. කෙසේ නමුත් මෙම වසර අවසානයේදී උද්ධමනය තනි ඉලක්කමක් දක්වා යොමුවීම වත්මන් රජයේ වැඩපිළිවෙල බව පසුගියදා මුදල් ඇමතිවරයා වන ජනාධිපති රනිල් වික්‍රමසිංහ සඳහන් කොට සිටියේය.

2023 වර්ෂයෙහි උද්ධමනය තනි ඉලක්කමක් දක්වා පත්වීමට අදාළව වන පුරෝකථනයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කොට ඇත්තේ මෙසේය.

දැනට පවතින තොරතුරු අනුව උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවතින අතර පෙර පැවැති පුරෝකථනයන්ට වඩා වැඩි වේගයකින් උද්ධමන අනුපාතය අඩුවී 2023 වසරේ තුන්වන කාර්තුව වන විට තනි අගයක මට්ටමට ළඟා වනු ඇත. මෙලෙස උද්ධමනය පහළ යෑම කෙරෙහි දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම, ඉන්ධන සහ ගෑස් මිල අඩුවීම, ආහාර මිල ගණන් යථා තත්වයට පත්වීම, මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් සහය වනු ඇතැයි මහ බැංකු සංනිවේදන දෙපාර්තමේන්තුව පසුගියදා නිවේදනය කර තිබිණි.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 අප්‍රේල් | 2023 මැයි |
|---|---|---|
| දර්ශක අගය | 192.3 | 192.3 |
| මාසික වෙනස (%) | -1.4 | 0.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 35.3 | 25.2 |

කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය




කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | ජූනි | 171.7 | 154.7 | 11.8 | 8.8 | - | - |
| | ජූලි | 178.9 | 160.9 | 4.2 | 4.0 | - | - |
| | අගෝස්තු | 182.8 | 163.6 | 2.2 | 1.7 | - | - |
| | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

ඒ අනුව රටක ආර්ථික දත්තයන්ගේ මූලිකත්වය ගන්නා උද්ධමනය පෙර වර්ෂයට වඩා අඩු අගයක් ගන්නා ආකාරය ඉහත වගුව මගින් දැක ගත හැකිවේ.

## ආර්ථික වර්ධනය

රටක අර්ථික වර්ධන වේගය අනුව එම රටේ සංවර්ධනය සීමාවන් තීරණය කරනු ලබයි. සංඛ්‍යා දත්ත හා සැබෑව අතර මෙහිද යම් යම් ගැටුම් පැන නැගිය හැකි වුවත් ආර්ථික වර්ධන වේගය මගින් එම රාජ්‍යයෙහි නිෂ්පාදයේ හා ජාතික ආර්ථිකයේ වර්ධනය පෙන්නුම් කරනු ලබයි. මෙය ආර්ථික විද්‍යාත්මකව දක්වන්නේ නම්, සාමාන්‍යයෙන් අවුරුද්දක කාල සීමාවක් තුළ රටක පුද්ගලයකුගේ දළ දේශීය නිෂ්පාදිතයේ හෝ ජාතික ආදායමේ සිදුවන වැඩිවීමකි. එනම්, එක් එක් පුද්ගලයා සතුව ඇති ආදායම් වර්ධනය වන්නේ නම්, වැඩි ආර්ථික වර්ධනයක් ඇති බව කියනු ලැබේ.

සැබෑවටම එක් පුද්ගලයෙකුගේ ආදායම මෙහිදී නිර්ණායක වුවත් සමස්ත ජනගහනයේ එකතුවක් ලෙස ගැනීමෙන් මෙහි ප්‍රතිඵලයක් ලෙස ගණනය කිරීම සිදු කෙරේ.

මේ අනුව ලංකාවේ සමස්ත ජනගහනයේ යම් කාල සීමාවක් තුළ නිෂ්පාදනය හා ආදායම සලකා එය ජගහනයෙන් බෙදීමකට ලක් කොට නිර්ණායකයට පැමිණේ. ලංකාවේ පසුගිය කාලය තුළ ඇති වූ ආර්ථික වර්ධන වේගය ගත හොත් 2022 වර්ෂයේදී පළමු කාර්තුවේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 2021 වර්ෂයේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.0ක වර්ධනය හා සසඳන විට පසුබෑමට ලක්වෙමින් සියයට 1.6කින් සංකෝචනය වී සෘණ ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති බව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

මෙය 2023 වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය -4.3කින් හැකිලෙනු ඇති බව ලෝක බැංකුව පවසයි. රට තුළ අර්බුද ගණනාවකින් පසුවද මෙවැනි අගයක ආර්ථිකය පිහිටීම රාජ්‍ය මැදිහත්වීමේ හා ආර්ථික උපායමාර්ගයන්හි වර්ධනීය තත්වයක් බව ලෝක බැංකු වාර්තා වැඩිදුරටත් සඳහන් කොට සිටී. නමුත් ආර්ථික ප්‍රතිසංස්කරණයන් මත ඉදිරි වසර දෙකතුන තුළදී වන විට සියයට 3කට එහා ගිය වර්ධනයක් අපෙක්ෂා කරයි.

## සංචිත ඉහල යාම

රටක ආර්ථිකයේ තවත් එක් පැතිකඩක් වන්නේ විනිමය අනුපාතය හා විදේශ සංචිත ප්‍රමාණයේ ඉහල යාමයි. පසුගිය වර්ෂයට සාපේක්ෂව මේ වර්ෂයෙහි සංචිත ප්‍රමාණය ඉහල යාමක් පෙන්නුම් කරන අතර එය පසුගිය මාසයේ පෙන්නුම් කරනු ලැබූවේ ඇමරිකානු ඩොලර් මිලියන 3483ක් ලෙසය. පසුගිය මැයි මාසය තුළ පමණක් ඩොලර් මිලියන 728ක වැඩිවීමක් පෙන්නුම් කොට ඇති අතර වසර අවසාන වන විට නිල සංචිත ඩොලර් මිලියන 4,431ක් දක්වා වර්ධනයක් අපේක්ෂා කරයි.

එම ඉලක්කයට තවත් අඩු ඩොලර් මිලියන 948ක් පමණක් වන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන්නට නියමිත ඩොලර් මිලියන 334ක දෙවන වාරිකයද සැලකූ විට ඉදිරි මාස හතක කාලය තුළ මහ බැංකුව විසින් ශුද්ධ ලෙස වෙළඳපොළෙන් මිල දී ගත යුතුව තිබෙන්නේ ඩොලර් මිලියන 614ක පමණ ප්‍රමාණයක් පමණය. දැනට තිබෙන වර්ධනයන් අනුව ඒ පහසු කරුණක් වෙනු ඇත.

## විනිමය අනුපාතය

විනිමය අනුපාතය තුළ ඇමරිකානු ඩොලරයේ පහත වැටීමක් දිගින් දිගටම සිදුවෙමින් පවතින අතර විනිමය අනුපාතිකය පසුගිය මාසයට සාපෙක්ෂව මේ වන විට 290 දක්වා සීමාවකට පහත වැටී තිබේ. මෙයට හේතුව මේ දක්වා රාජ්‍යමූල්‍ය කළමනාකරණය ඉලක්කවලට ඉදිරියෙන් පැවතීම සහ ඒ හේතුව මත මුදල් සැපයුම සීමා වී උද්ධමනය ඉලක්ක මට්ටමටද වඩා අඩු වීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකය පෙර ඇස්තමේන්තු කළ තරමට නොහැකිළී වඩා ඉක්මණින් නැවත වර්ධනය වීමට ඉඩ ඇති බව ආර්ථික විශේෂඥයින් මත පළ කරමින් තිබේ.




ලංකාව තුළ පසුගිය වර්ෂ කිහිපය තුළ පැවැති ආර්ථික බිඳ වැටීම ක්‍රමයෙන් ශක්තිමත්ව පොලී අනුපාතිකය වැනි ආර්ථිකයේ මූලික දත්තයන් පහත වැටීම ජනතාව අපෙක්ෂාකරන මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමක් ලෙස දැක්විය හැකිය.

වත්මන් රජය විසින් ක්‍රියාත්මක කරමින් සිටින් ආර්ථික ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් අවලාද හා දෝෂාරෝපණයන් කොතෙකුත් ඇත. සිහිබුද්ධියෙන් කල්පනා කරන්නෙකුට මේ වන විට රටේ ආර්ථිකය ගොඩනැගීමේ පදනම් ශක්තිමත් වන බවට මෙකී දත්ත විසින් පෙන්නුම් කරමින් සිටින බවට අවබෝධ කර ගැත හැකිවේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය සහනය සහ එම නිර්දේශ මඟින් සාර්ථකව සිදුවන ආර්ථික ප්‍රතිසංස්කරණ හමුවේ ඉදිරි සංවර්ධනීය ඉලක්ක සපුරාලීම සිදු වෙනු ඇති බව මෙම දත්ත මගින් පැහැදිලිය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් රාජ්‍ය යාන්ත්‍රණය නිවැරදිව මෙහෙයවමින් මේ ක්‍රියාවට නංවා ඇත්තේ සුළුපටු ක්‍රියාදාමයක් නොවන බව ගෙවී ගිය මාස කිහිපය තුළ ඔප්පු කොට අවසන්ය. කොරෝනා අර්බුදය, මුග්ධ ආර්ථික කළමණාකරණය, දූෂණයෙන් හා නාස්තියෙන් විනාශ වී ගිය රටේ ආර්ථික දේහය මෙලෙස නැවත ශක්තිමත් වීම මඟින් ඉදිරි ඉලක්ක සපුරාලීම සඳහා වන පදනම වැටී ඇත. මෙය සිදු නොවන්නට රටම තවමත් පෝලිම් පිට පෝලිම්වල සිටිමට නියමිත විය. ආර්ථික සංඛ්‍යා දත්ත වල සෘණ අගයන්හි ගනනය කරමින් සිටින්නට සිදු වෙනු ඇත. කොහොම නමුත් ඉහල ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පාර කැපීමට අවැසි ශක්තිය රජයට ඇති බව මේ වන විට පෙන්වා ඇති අතර ඒ සඳහා සියළු පාර්ශවයන් හී සහය ලබා දීම ඒ ඉලක්ක අපේක්ෂා කරන කාලයට පෙර සම්පූර්ණ කිරීමට දායකවීමක් වෙනු ඇත.

කේ.පී.අයි. ප්‍රියංගනී

# Investment promotion strategy in times of crisis and beyond

To drum up foreign direct investment and domestic investment in Sri Lanka, President Ranil Wickremesinge has put forward a strategic plan that defines a goal or desired outcome and includes the major steps or milestones needed to reach the required target at the right time.

As the country's leader and savior of the island nation, President Wickremesinge will go ahead with his road map for economic recovery overcoming all obstacles and roadblocks and back stabbing of opposition politicians and saboteurs with their own agendas.

These so-called opposition political party leaders, especially the left wing subversives like the Janatha Vimukthi Peramuna and Frontline Socialist Party have pulled the country backwards from its forward march towards economic reforms during the past four decades.

The promotion of investments play a crucial role in boosting a country's economy. The government has also recognised the significance of collaboration between the public and private sectors in the country's journey towards economic growth.

The goal is to transform Sri Lanka into an export-oriented economy that is globally recognised, following the successful models of countries like South Korea and Singapore, President Wickremesinghe told the nation recently.

Furthermore, the present administration aims to prioritise modern and sustainable efforts such as renewable energy, green hydrogen, and digitisation.

Over the next few months, the government will make a special invitation to the private sector to submit their own business proposals that align with the vision of modernisation and sustainability.

The selection of project proposals for investments is based on four key criteria:1. size of private investment 2. job creation, 3. export contribution, and 4. economic contribution.

To ensure the effective implementation of these business proposals, the government will introduce a new system called the lab methodology.

Under the lab approach, action will be taken to bring together government ministers, government officials, subject matter experts, and key representatives from the private sector to collaboratively engage in detailed discussions over a period of six weeks.

The aim is to collaboratively resolve any roadblocks hindering the roll-out of investments and projects by listening carefully to the private sector.

During these discussions, comprehensive implementation plans will be developed, and the necessary facilities to support the implementation of these projects will be organized.

Government stakeholders involved in the 'Labs' will dedicate their full-time efforts to ensure the successful execution of these projects.

Sri Lanka is capable of meeting its goal of attracting USD 5 billion in



foreign direct investments (FDI) by 2025. Higher levels of FDI would also strengthen exports, foster growth and assist the country to put its debt on a more sustainable footing.

The World Bank also said that it believes this is entirely doable given the country's rich natural resources, strategic location, highly literate workforce and opportunities for investment in tourism, IT enabled services, logistics, high value-added apparel and food services among others.

However, for Sri Lanka to leverage on these competitive advantages, the World Bank called for the country to focus on comprehensive reforms to increase productivity and competitiveness.

It has identified that in some sectors such as textile and clothing, IT and manufacturing Sri Lankan firms have been expanding their footprint and have been able to become very competitive globally and move up the value chain to more sophisticated products and markets.

According to the World Bank Country Director for Sri Lanka, Nepal, and Maldives Faris Hadad- Zervos, Sri Lanka is currently placed 99th in the latest Ease of Doing Business rankings.

As such, he called for policy makers to focus on export earnings in comparison to overall GDP and track its growth consistently to identify what policy changes are needed to improve competitiveness and reach.

He also advocated for a fresh look at tariff systems and improved access to intermediate imports needed for export value addition.

Sri Lanka's FDIs have failed to achieve the desirable impact amidst the present economic setback, policy uncertainty and political instability along with the removal of tax concessions including tax holidays, a ministerial consultative committee report has revealed.

The Board of Investment (BOI), now acting as an intermediary rather than facilitator, has been directed to provide actual FDI data to the Central Bank and the Treasury as it should be armed with a clear record on foreign investment projects and the actual value of investments, the committee advised.

Since the establishment of this export promotion entity approximately 40 years ago, the institution has managed to attract only USD 20 billion in FDI, it added. It has been observed that the average annual FDI inflow has been merely USD 500 million.

It has been observed that the granting of tax exemptions was one of the BOI's main roles until the responsibility moved to the Ministry of Finance in 2011.

However, the lack of clarity in BOI records of FDI inflows, number of project proposals received and number of projects approved or registered has confused actual data.

With no plans and strategies properly being implemented during the previous administration, the BOI has become a burden to the state as a dormant institution after four decades of poor performance in its role of investment facilitator, a foreign investment report of the Finance Ministry revealed.

Another main accounting practice of the BOI was the inclusion of foreign loans to Direct Investment Enterprises in annual FDI while publicising dollar earnings of existing free trade zone enterprises.

Despite setbacks, the BOI has attracted FDI inflows amounting to USD 713 million in the first nine months of 2022, which is 71 per cent of the 2022 full-year target of USD 1 billion, State Minister of Investment Promotion Dilum Amunugama said recently.

However, according to Finance Ministry estimates computed by using mathematical models, the FDI in 2022 will be in the region of USD 476 million excluding foreign loans obtained for ongoing projects.

Under the new leadership however, the BOI is looking at targeted Initiatives to get from USD 1 billion in 2022 to USD 2 billion in 2023. Attracting 100 technology services companies with a new product, a targeted program to get 50 existing BOI companies to reinvest.

The other measures were the setting up industry advisory councils for the four thrust sectors for leads, policy tweaking and promotion, digitalisation of key investor services, aggressive promotion of the destination, key account management and modernisation of existing zones to meet with international green standards.

Furthermore, there is a large number of new sectors which are emerging, associated with digitalisation and with the new economy.

The traditional sectors too have new elements coming out as sub-sectors. Whilst the larger sectors like petroleum, power, infrastructure, healthcare, manufacturing which bring you the big FDIs. However the sectors of the future will be the new sectors which are now emerging.

Even though Sri Lanka's internal market size is small, with a population of around 22 million, Sri Lanka has signed three free trade agreements with India, Pakistan and Singapore providing market access to 1.6 billion consumers on a duty-free basis.

Sri Lanka is also a member of the South Asian Free Trade Agreement (SAFTA), Asia Pacific Free Trade Agreement (APTA) and the country is eligible for duty free access to 27 EU countries under the EU GSP+ scheme and also is eligible for duty free access to the UK under the UK DCTS.

The government is to set up a new agency by bringing the Board of Investment, the Export Development Board and the Sri Lanka Export Credit Insurance Corporation together into one platform.

The National Enterprise Development Authority and other entities that support exports and investments will also come under the purview of the new agency.

The government has taken this decision after evaluating the performance of these institutions during the recent past as on average, it takes around 170 days to approve an investment project in Sri Lanka as these processes involve over 40 line agencies, it has been observed.

At present, there are 73 project proposals still to get approval at around 10 different agencies. The delay in approving the projects does not augur well for investors.

Meanwhile, a high-level review of the National Trade Facilitation Committee (NTFC) was conducted this week chaired by President's Secretary Saman Ekanayake in a bid to accelerate trade facilitation commitments and bolster the business landscape in Sri Lanka.

In order to streamline compliance and optimize performance, several directives were issued during the meeting. Firstly, it was decided to establish the NTFC Secretariat under the supervision of the Ministry of Finance. Secondly, immediate measures will be taken to address the staffing requirements of the Secretariat.

The high-level review of the NTFC's performance underscored the urgency of the Wickremesinghe administration in taking decisive action to enhance the business environment in Sri Lanka.

By addressing key issues such as staffing, budget allocation, and the implementation of the National Single Window, the government aims to expedite trade facilitation commitments and promote a conducive atmosphere for businesses in the country.

**Carcharodon**

CHATHAM STREET JOURNAL



# இலங்கையின் "ஷியட்டல்"



உலகில் 3000 வருடங்களுக்கும் அதிகமான வரலாற்று பாரம்பரியத்தை கொண்ட மக்கள் இனமாக விளங்கும் செவ்விந்திய மக்கள் பற்றி பேசுகின்ற போது அவ்வினத்தின் ஆரம்பகால தலைவராக விளங்கியவர் என வரலாறுகள் கூறும் "ஷியட்டல்" என்பவரை இன்று வரை உலகம் மறக்கவில்லை, அவர் மறைந்து போயிருந்தாலும் தற்கால மனிதர்கள் சுற்றாடல் மீதான கரிசனை அற்றவர்களாக செயற்படுகின்ற காரணத்தினால் மேற்படித் தலைவரின் சுற்றாடல் தொடர்பிலான கூற்று இன்று வரையில் வலிதானதாக காணப்படுகின்றது.

அமெரிக்க அரசாங்கம் செவ்விந்தியர்களின் நிலங்களை விலைக்கு வாங்க முற்பட்ட போது □நிலங்களுக்கு சொந்தக்காரர்கள் என எவரும் இல்லாத போது அதனை விற்பனை செய்யும் அதிகாரமும் விலைக்கும் வாங்கும் அதிகாரமும் எவருக்கும் இல்லை.இயற்கையின் ஒவ்வொரு அம்சங்களும் எமது முன்னோர்களின் மூச்சுக்காற்று" என்று சுற்றாடல் மீது தாம் கொண்ட காதலை வெளிப்படுத்தியிருந்தார்.

அதேபோல், மஹிந்த தேரரின் வருகையை தொடர்ந்தே இலங்கையில் பௌத்த மதம் அறிமுகமானதென்ற வரலாறுகளே தற்போது வரையில் நம்பட்டு வருகின்றது.

இலங்கைக்கு பௌத்த மதத்தை போதித்தவரான மஹிந்த தேரரின் வருகையின் நினைவாக அனுட்டிக்கப்படும் பொசன் மாதமும் இதுவாகும். பௌத்த மதத்திற்கு மேலதிகமாக மஹிந்த தேரரின் வருகையின் போது இலங்கையருக்கு உணர்த்தப்பட்ட மற்றுமொரு அற்புதமான பாடமும் உள்ளது.

குறிப்பாக மஹிந்த தேரர் வருகை இடம்பெற்றதாக கூறப்படும் காலத்தில் அப்போது இலங்கையை ஆண்ட தேவநம்பியதீச மன்னருக்கும் மஹிந்த தேரரும் இடையில் நிகழ்ந்த சுற்றுச்சூழல் பற்றிய உரையின் போது □மகாராசனே இந்த பூமியின் சொந்தகாரர்கள் அனைத்து விலங்கினங்களுமாகும். நீங்கள் அதன் நம்பிக்கை பொறுப்பாளர் மாத்திரமே" என்ற அறிவுரையை போதித்ததாக வரலாறுகள் கூறுகின்றன.

இலங்கையின் பெரும்பான்மையின மக்கள் மஹிந்த தேரரின் அறிவுரைகளை அடிப்படையாக கொண்டு வாழ்பவர்கள் என்ற வகையில், மஹிந்த தேரர் சுற்றுச்சூழல் பற்றிக் கூறிய அறிவுரைகளை மறந்துபோனது கவலைக்குரியது.இந்த விடயம் இலங்கையின் பெரும்பான்மையின மக்களுக்கு மட்டும் மட்டுப்பட்ட விடயமல்ல. இராமாயணத்தில் சுந்தர காண்டத்தில் கூறப்பட்ட வனப்புக்களை எம் கண்முன்னே காண்பிக்கும் அளவுக்கு மலையக தேசத்தை வடிவமைத்த எமது முன்னோர்களுக்கும் வடக்கு கிழக்கு பூமியின் இறுக்கமான மண்ணை இதமாக்கி அதன்மீது பயிர் விதைத்து அன்னம் அளித்த எமது முன்னோர்களின் அர்பணிப்புக்கும் தமிழர்களான நாமும் உரிய மதிப்பை அளிக்கிறோமா என்பதும் கேள்விக்குரியாகவே உள்ளது.

நமது முன்னோர்கள் தமது வாழ்வாதார செயற்பாடுகளை சுற்றாடலுடன் ஒருமித்ததாகவே வடிவமைத்து வைத்திருந்த நிலையில் அவர்களுக்கு சுற்றுச்சூழல் பாதுகாப்பானது சவாலானதாக இருக்கவில்லை. இருப்பினும், இன்றளவில் மக்கள் வாழ்க்கைச் செயற்பாடுகளும் சுற்றாடலுக்கும் இடைய ஏற்பட்டுள்ள விரிசல் காரணமாக சுற்றுச்சூழல் பாதுகாப்பு சவால்களை எதிர்கொண்டுள்ளதை போன்றே மக்கள் வாழ்வியலும் அனர்த்தங்களை எதிர்கொள்ள வேண்டிய நிலைமைக்கு தள்ளப்பட்டுள்ளனர்.

அதனை, இன்று நாம் காண்கின்ற காலநிலை அனர்த்தங்கள் மற்றும் மாற்றங்கள் ஊடாக உணர்ந்துகொள்ள முடியும். இந்நிலையில் அபிவிருத்தி அடைந்த இலங்கை உருவாகிவிடும் என்று நீண்டகாலமாக கனவு காண்கின்ற நாம் இலங்கையின் அபிவிருத்திக்கு நம்மால் என்ன பங்களிப்புச் செய்ய முடியும் என்பதை உணர தவறிவிட்டடோம். அதற்கு ஏற்றாற்போல் இலங்கையின் அரசியல் துறையும் சுற்றாடல் பாதுகாப்புச் செயற்பாடுகள் மீது வலுவான அக்கறை காட்ட தவறியதால் இன்றும் நாம் சுற்றுச்சூழல் பாதுகாப்பு பற்றிய அதிக அவதானம் செலுத்த வேண்டிய நிலையில் உள்ளோம்.

எவ்வாறாயினும் இலங்கை சுதந்திரம் பெற்று 75 வருடங்களையும் கடந்துவிட்ட நிலையிலேயே தற்போது அபிவிருத்தி அடைந்த இலங்கையை உருவாக்குதற்கான வழிமுறைகளை காண்பிக்கும் தலைமைத்துவம் இலங்கைக்கு கிடைத்துள்ளது. அந்த வகையில் சிறிது ஆறுதல் கொள்ள முடிந்தாலும் அந்த தலைமைத்துவத்திற்கு ஒத்துழைப்பு வழங்க வேண்டியதன் அவசியத்தை பலரும் முழுமையாக உணராமலேயே உள்ளனர்.

சுற்றாடல் பாதுகாப்பு தொடர்பில் ஜனாதிபதி ரணில் விக்ரமசிங்க தொடர்ச்சியாக உந்துதல்களை ஏற்படுத்த விளைகிறார். புதியதொரு இலங்கையை செதுக்கும் பணிகளை ஆரம்பித்துள்ள அவர் அதற்கான நிலையானதும் சரியானதுமான வழியென பசுமை பொருளாதாரத்தை பரிந்துரைத்துள்ளார். அத்தோடு அபிவிருத்திப் பாதைக்கான வழிகாட்டியாகவே தான் திகழ முடியும் என்பதால் அபிவிருத்திக்கான வழிமுறைமைகளை எடுத்துக்கூறும் அவர் அதற்கான பணிகளை முன்னெடுக்குமாறு இந்நாட்டின் இளைஞர்களுக்கு அழைப்பு விடுத்துள்ளார்.

மறுமுனையில் உலக நாடுகள் அனைத்தும் இலங்கையை திரும்பிப் பார்ப்பதற்கான வாய்ப்பையும் அவர் உருவாக்கியுள்ளார். அதற்காக அடுத்த வருடம் இலங்கைக்குள் சர்வதேச சுற்றாடல் பல்கலைக்கழகம் உருவாக்கப்படவுள்ளது என்றும் ரணில் விக்ரமசிங்க உறுதியளித்துள்ளார். நியூசிலாந்து மற்றும் ஜப்பான் போன்ற நாடுகளில் போன்று இலங்கையின் இயற்கை சிறப்பம்சங்களையும் உயிர்ப்புள்ள அம்சங்களாக அறிவிக்க ஜனாதிபதி தீர்மானித்துள்ளமையும் வரவேற்புக்குரியது என்று சுற்றாடல் ஊடகவியலாளர் அருண டயஸ் பாராட்டு தெரிவித்துள்ளார்.

மறுமுனையில் நாட்டில் காணப்படும் 43 வருடங்கள் பழமையானதான சுற்றாடல் சட்டத்தில் திருத்தங்களை செய்வதற்கான யோசனையையும் ஜனாதிபதி ரணில் விக்ரமசிங்கவிற்கு முன்மொழிந்துள்ளார். சுற்றாடல் தினத்தில் மாத்திரமே சுற்றாடல் பாதுகாப்பு பற்றிய பேச்சுக்களை கேட்க முடியும் என்ற நிலைமைக்கு மாறாக இன்று நாட்டின் தலைமைத்துவம் சுற்றாடல் பாதுகாப்பு மற்றும் எமது அபிவிருத்தி இலக்குகளை சுற்றாடலுடன் சார்ந்து முன்னெடுப்பதற்கான திட்மிடல்களை முன்மொழிவதானது பாராட்டுக்குரியதாகும்.

இவற்றோடு ஜனாதிபதி ரணில் விக்ரமசிங்க இலங்கையின் சுற்றாடல் பாதுகாப்பு மாத்திரமின்றி அதற்கு சுற்றுச் சூழலை பாதிக்கும் வகையில வல்லரசு நாடுகள் முன்னெடுக்கும் சில திட்டங்கள் காரணமாக சிறிய நாடுகள் பெரும் பாதிப்புக்களை எதிர்கொள்கின்றன என்பதையும குறிப்பாக இந்தியாவின் வளி மாசடைவின் பாதிப்பை இலங்கை எதிர்கொண்டு வருகின்ற போதும் அதற்கு காரணமான நாடுகள் அதற்கான நிவாரணங்கள் எவற்றையும் இன்று வரையில் வழங்காமல் இருப்பது கவலைக்குரியது என்ற விடயத்தை பகிரங்கமாக சுட்டிக்காட்டியிருந்தார். இந்த கூற்று வல்லரசு நாடுகளின் காதுகளை எட்டும் போது அதனால் கிடைக்கும் நிவாரணம் இலங்கைக்கு மாத்திரம் மட்டுப்பட்டதாக அல்லாமல் காலநிலை மாற்றத்தினால் பாதிக்கப்படுகின்ற உலகின் சிறிய நாடுகள் பலவற்றுக்கும் பலனளிக்கும்.

அதேபோல் பசுமை பொருளாதாரத்தின் ஒரு அங்கமாகவும் தொழில்நுட்பச் செயற்பாடுகளிலிருந்து சுற்றுச்சூழலை பாதுகாப்பதோடு அவற்றினூடாக பயன்களை பெற்றுக்கொள்ளும் நோக்கில் புதிய செயலகம் ஒன்றின் கீழ் விவசாய நவீனமயப்படுத்தல் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.

இவ்வாறாக ஜனாதிபதி ரணில் விக்ரமசிங்கவின் திட்டங்களை கருத்திற்கொண்டே, ஐக்கிய நாடுகளின் 28ஆவது காலநிலை மாற்ற மாநாடான (ஊழ்ீ 28) இல் பங்கேற்குமாறு ஜனாதிபதி ரணில் விக்ரமசிங்கவிற்கு ஐக்கிய அரபு இராச்சிய ஜனாதிபதி மொஹமட் பின் சயீத் அல் நஹ்யான் (ஆழாயஅநன டிைை ணுயலநன யுட யோலயெ) அழைப்பு விடுத்துள்ளார்.

ஐக்கிய அரபு இராச்சியத்தின் ஜனாதிபதியினால் அனுப்பப்பட்ட அழைப்புக் கடிதம், ஐக்கிய அரபு இராச்சியத்தின் இலங்கைக்கான தூதுவர் காலீத் நாசர் அல் அமெரியினால் கடந்த மாதம் ஜனாதிபதியிடம் உத்தியோகபூர்வமாக கையளிக்கப்பட்டிருந்தது.

குறித்த மாநாடு எதிர்வரும் நவம்பர் 30 முதல் டுபாயில் உள்ள எக்ஸ்போ சிட்டியில் உலகத் தலைவர்கள், அரச பிரதிநிதிகள், சூழலியலாளர்கள், புத்துஜீவிகள் ஆகியோரின் பங்களிப்புடன் ஆரம்பமாக உள்ளது. காலநிலை மாற்றம் மற்றும் நாடுகள் அதை எவ்வாறு சமாளிக்க திட்டமிட்டுள்ளன என்பது குறித்த உரையாடலுக்கான முன்னணி சர்வதேச களமாக காலநிலை மாற்ற உச்சிமாநாடு அமைந்திருக்கும் நிலையில் இம் மாநாட்டில் ஜனாதிபதி ரணில் விக்ரமசிங்க ஆற்றவுள்ள உரை குறித்த எதிர்பார்ப்புக்கள் தற்போதும் மேலோங்கியுள்ளன. ரணில் விக்ரமசிங்கவின் உரை உலக நாடுகளின் கவனத்தை ஈர்த்து வரும் நியைில், அண்மைக்காலமாக உலக நாடுகள் இலங்கையைத் திரும்பிப் பார்க்கத் தொடங்கியுள்ளன.

கணேசன் கமலநாதன்







පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී